

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(PGIIM)

කොළඹ විශ්වවිද්‍යාලය

2023 වාර්ෂික වාර්තාව සහ ගිණුම්

මෙම වාර්තාව පිළිබඳව

මෙම වාර්තාවට දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) පිළිබඳ 2023 වර්ෂය සඳහා වූ වාර්ෂික තොරතුරු ඇතුළත් වේ. එමඟින් 2022 ජනවාරි මස 01 වැනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පොදු තොරතුරු, කාර්යසාධනය සහ ජයග්‍රහණ පිළිබඳ තොරතුරු විස්තරාත්මකව ඇතුළත් වේ.

වාර්තාකරණ රාමු සහ විෂයපථය

මෙම වාර්තාවට පශ්චාත් උපාධි පුහුණුවන්නන්ගේ පවත්වනු ලබන අධ්‍යයන වැඩසටහන්, මානව සම්පත්, ජයග්‍රහණ, සහ මූල්‍ය කාර්යසාධනය සහ වාර්ෂික ගිණුම් ආදිය පිළිබඳ විස්තර අන්තර්ගත වේ.

දැක්ම

රටේ සෞඛ්‍ය අවශ්‍යතාවන් සපුරාලීම සහ ප්‍රතිචාරාත්මක ආකාරයකින් කලාපීය සහ ගෝලීය සෞඛ්‍ය වෙනුවෙන් කැපවීම පිණිස ඉහළ වෘත්තීමය ප්‍රමිතීන් අත්කර ගත් ආයුර්වේද, යුනානි, සිද්ධ සහ සාම්ප්‍රදායක සෞඛ්‍ය විශේෂඥයින් බිහි කරන විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.

මෙහෙවර

ශ්‍රී ලංකාවේ, කලාපයේ සහ ලෝකයේ ජනතාව වෙනුවෙන් ප්‍රශස්ත මානුෂීය සෞඛ්‍ය රැකවරණයන් ලබා දීම පිණිස විශිෂ්ට සායනික සහ පර්යේෂණ නිපුණතාවලින් සවිබල, ආයුර්වේද, යුනානි, සිද්ධ සහ සාම්ප්‍රදායක වෛද්‍ය ක්‍රම පිළිබඳ දැනුම සහ කුසලතා ඇති විශේෂඥයින් බිහි කිරීම.

ඉලක්ක

1. රටේ සෞඛ්‍ය අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම පිණිස ආයුර්වේද, යුනානි, සිද්ධ සහ සාම්ප්‍රදායක සෞඛ්‍ය වෘත්තිකයින් බිහි කිරීම
2. දේශීය වෛද්‍ය විද්‍යා අංශය තුළ විශිෂ්ටත්වයක් අත් කර ගැනීම පිණිස නම්‍යශීලී ශික්ෂණ සහ ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම
3. දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ක්ෂේත්‍රය තුළ පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම
4. කාර්යක්ෂම සහ ඵලදායී පරිපාලන සහ මූල්‍ය කළමනාකරණයක් හරහා විශිෂ්ට පාලන ක්‍රමයක් ගොඩනැගීම
5. ආයතනයේ ගුණාත්මකභාවය සහතික කිරීම සහ වර්ධනය වන අධ්‍යාපනික අවශ්‍යතාවන්ට විසඳුම් සෙවීම පිණිස යටිතලපහසුකම් ව්‍යාප්ත කිරීම.

පටුන

Page No.

වාර්තාව පිළිබඳව…….. i
වාර්තාකරණ රාමු සහ විෂයපථය …… i
දැක්ම ……..... ii
මෙහෙවර …….. ii
ඉලක්ක …… ii
අධ්‍යක්ෂවරයාගේ පණිවුඩය…… iv
වගු ලැයිස්තුව ……. v
රූපසටහන් ලැයිස්තුව…….. v
කෙටි පද ලැයිස්තුව ……. v

පළමු වැනි කොටස - වාර්ෂික වාර්තාව – 2023

1 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය …….. 2
1.1 ආයතනය - කෙටි හැඳින්වීම …… 2
1.2 ආයතනයේ අධ්‍යක්ෂවරයා …… 5
1.3 කළමනාකරණ මණ්ඩලය…… 5
1.4 මූල්‍ය කමිටුව……. 7
1.5 අධ්‍යයන මණ්ඩල……. 7
1.6 පුස්තකාල කමිටුව…….. 10
1.7 විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුව…… 10
1.8 අන්තර්ජාතික සහයෝගිතාව සඳහා වූ කමිටුව …….. 11
1.9 අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කේන්ද්‍රය…… 12
1.10 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාරසභරාවේ සංස්කාරක කමිටුව …… 13

2 2023 වර්ෂය තුළ අධ්‍යයන කටයුතු
2.1 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා ශිෂ්‍යයින් බඳවා ගැනීම …… 14
2.2 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුහුණුවන්නන් සංඛ්‍යාව …… 14
2.3 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෝෂ්ඨ ලේඛකාධිකාරී පුහුණුවන්නන් සංඛ්‍යාව…… 15
2.4 විභාග ප්‍රතිඵල …… 16
2.5 වෛද්‍ය විශාරද පශ්චාත් උපාධි වැඩසටහන් අනුමත කිරීම…….. 16
2.6 වෛද්‍ය විශාරද ආයුර්වේද අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වැඩසටහන්…….. 17
2.7 වෛද්‍ය විශාරද යුනානි අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වැඩසටහන් …… 17
2.8 වෛද්‍ය විශාරද සිද්ධ අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වැඩසටහන්……... 17

3 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන අංශ සහ පුස්තකාලය
3.1 පරිපාලන අංශය…….. 18
3.2 මූල්‍ය අංශය……... 18
3.3 පුස්තකාලය…….. 19

4 මානව සම්පත් දත්ත
4.1 අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය……... 20

දෙවැනි කොටස - අවසාන ගිණුම් සහ විගණන තොරතුරු

5 2023 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන…… 22
6 විගණකාධිපති වාර්තාව……..... 53
7 විගණකාධිපති වාර්තාවට පිළිතුර……. 58
8 තිරසර සංවර්ධනය සඳහා යෝජනාව…… 60
9 භෞතික සහ මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණ…… 62

අධ්‍යක්ෂවරයාගේ පණිවුඩය



2023 වර්ෂය සඳහා වූ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIIM) වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මාගේ ඉමහත් ප්‍රීතියට කරුණකි. ආයුර්වේද, සිද්ධ, යුනානි සහ දේශීය වෛද්‍ය ක්‍රමය යන ක්ෂේත්‍රවල විශේෂඥ වෛද්‍යවරු බිහි කිරීමේ වගකීම ඇති එකම ආයතනය වශයෙන් 2023 වර්ෂය දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා ඉතා වැදගත් වර්ෂයක් විය. ඒ අනුව 2023 වර්ෂය තුළ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ශක්තිමත් අධ්‍යයන සහ මූල්‍ය ප්‍රමිති පවත්වා ගනිමින්, එහි දැක්මට අනුකූලවූ සාර්ථක ප්‍රගතියක් අත්කර ගැනීමට සමත් විය.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ආයුර්වේද විශේෂඥ ක්ෂේත්‍ර පහක විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි පරීක්ෂණ පළමු වැනි වරට 2023 වර්ෂයේ දී එහි පළමු වැනි පුහුණුලාභීන් වෙනුවෙන් පවත්වන ලද අතර 2024 ජනවාරි මාසයේ දී පවත්වන ලද පශ්චාත් උපාධි ප්‍රදානොත්සවයේ දී අදාළ උපාධි ප්‍රදානය කරන ලදී. විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි පළමු වැනි ශිෂ්‍ය කණ්ඩායම වර්තමානයේ දී ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරීන් වශයෙන් සේවා ස්ථාන පාදක සායනික පුහුණු කටයුතුවල නිරත සිටිති.

අධ්‍යයන වැඩසටහන්, පරිපාලන සහ මූල්‍ය කටයුතු ආදියේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම පිණිස ස්ථාපිත කරන ලද අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කේන්ද්‍රය (IQAC) කොළඹ විශ්වවිද්‍යාලයේ ආයතනික සමාලෝචනය සඳහා ස්වයං ඇගයීම් වාර්තා සකස් කිරීමට සක්‍රීයව දායක වී ඇත. එමෙන්ම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2023 වර්ෂයේ දී විවෘත මූලාශ්‍ර, සමීයුරු සමාලෝචන වාරසඟරාවක් සහ ප්‍රවෘත්ති සඟරාවක් දියත් කිරීමට ද මුලපුරා ඇත.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට එහි මෙහෙයුම් කටයුතු සඳහා ස්ථිර කාර්යාල පරිශ්‍රයක ස්ථාපිත කිරීම, ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරීන් සඳහා විදේශ පුහුණුව ආරම්භ කිරීම සහ ආයතයේ වර්ධනය සඳහා අත්‍යාවශ්‍ය වන පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම ආදිය ඇතුළත් අභියෝග රාශියකට අනාගතයේ දී මුහුණ දීමට සිදු වනු ඇත.

මෙම වර්ෂයේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සාර්ථකත්වය වෙනුවෙන් සිය දායකත්වය කැප කළ කළමනාකරණ මණ්ඩල, අධ්‍යයන මණ්ඩල, විශේෂඥ මණ්ඩල සාමාජිකයන්, පුහුණුකරුවන්, පරීක්ෂකවරුන්, අධීක්ෂකවරු, පුහුණුලාභීන් සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී (වැඩ බලන), සහකාර පුස්තකාලයාධිකාරී ඇතුළු දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාව පුද කිරීමට මා මෙය අවස්ථාවක් කර ගනිමි.

මහාචාර්ය එස්. එම්. එස්. සමරකෝන්
අධ්‍යක්ෂ
දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

වගු ලැයිස්තුව

1 වැනි වගුව	කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් විස්තර	5
2 වැනි වගුව	මූල්‍ය කමිටුවේ රැස්වීම් විස්තර	7
3 වැනි වගුව	අධ්‍යයන මණ්ඩලවල රැස්වීම් විස්තර	7
4 වැනි වගුව	අධ්‍යයන මණ්ඩලවල සභාපතිවරු සහ ලේකම්වරු	8
5 වැනි වගුව	විශේෂඥ මණ්ඩලවල රැස්වීම් විස්තර	9
6 වැනි වගුව	විශේෂඥ මණ්ඩලවල සභාපතිවරු සහ ලේකම්වරු	9
7 වැනි වගුව	පුස්තකාල කමිටුවේ රැස්වීම් විස්තර	10
8 වැනි වගුව	දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අභ්‍යාසලාභීන් බඳවා ගැනීම	14
9 වැනි වගුව	දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මුළු අභ්‍යාසලාභීන් සංඛ්‍යාව	14
10 වැනි වගුව	දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුහුණුව ලබන ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරීන් සංඛ්‍යාව	15
11 වැනි වගුව	විභාග ප්‍රතිඵල	16
12 වැනි වගුව	අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය	20

රූපසටහන් ලැයිස්තුව

රූපසටහන 1	ආයතනික ව්‍යුහය	4

සංකේත නාම ලැයිස්තුව

PGIIM	දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
IIM	දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
GWUIM	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය
BIMARI	බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය
BOM	කළමනාකරණ මණ්ඩලය
BOS	අධ්‍යයන මණ්ඩලය
SpB	විශේෂඥ මණ්ඩලය
MD	විශේෂඥ වෛද්‍ය උපාධිය
IQAC	අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කේන්ද්‍රය

පළමු වැනි කොටස

2023 වාර්ෂික වාර්තාව

1. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM)

1.1 කෙටි හැඳින්වීම

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ 2017 දෙසැම්බර් 08 වැනි දිනැති, අංක 2048/46 දරන දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය යටතේ කොළඹ විශ්වවිද්‍යාලයට අයත් ආයතනයක් ලෙස පිහිටුවා ඇති අධ්‍යාපන ආයතනයකි. ඒ අනුව මෙම ආයතනය සෞඛ්‍ය සේවා, විශ්වවිද්‍යාල සහ පෞද්ගලික අංශය සඳහා මානව සම්පත් අවශ්‍යතාවන් සපුරාලීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. සෞඛ්‍ය ව්‍යවස්ථා සංග්‍රහයට අනුව සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන ප්‍රධාන ක්ෂේත්‍රවල විශේෂඥ වෛද්‍යවරු සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයුර්වේදය, යුනානි සහ සිද්ධ අධ්‍යාපනය සඳහා විශේෂඥයින් සැපයීම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වගකීම වේ. ඒ අනුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය දිවයිනට අවශ්‍ය කරන ශ්‍රම බල අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන අධ්‍යයන පාඨමාලා ආරම්භ කිරීමට යෝග්‍ය පියවර ගෙන ඇත.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙහෙයුම් කටයුතු, කළමනාකරණ මණ්ඩලයේ පළමු වැනි රැස්වීම පැවැත්වීමෙන් පසුව 2019 මාර්තු මාසයේ දී ආරම්භ කරන ලදී. ආයතනය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ලබා දෙන තෙක් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අයත් බොරැල්ලේ පිහිටි ආයුර්වේද ශික්ෂණ රෝහල තුළ තාවකාලික ගොඩනැගිල්ලක ස්ථාපනය කර ඇත.

වර්තමානයේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විශේෂඥ වෛද්‍ය ආයුර්වේද වැඩසටහන් පහක් සහ විශේෂඥ වෛද්‍ය යුනානි වැඩසටහන් එකක් ඇතුළුව විශේෂඥ වෛද්‍ය විද්‍යා උපාධි වැඩසටහන් හයක් පවත්වනු ලබයි. 2020 සහ 2021 වර්ෂවල දී මෙම උපාධි වැඩසටහන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය හිමි විය. එමෙන්ම තවත් විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් හයක් (ආයුර්වේද වැඩසටහන් දෙකක්, සිද්ධ වැඩසටහන් දෙකක් සහ යුනානි වැඩසටහන් දෙකක්) සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂා කරනු ලැබේ. තව ද නව විශේෂඥ වෛද්‍ය ආයුර්වේද වැඩසටහනක් සහ ආයුර්වේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහනක් සඳහා ප්‍රවිවරණයන් (Prospectuses) සකස් කිරීමට ද දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පියවර ගෙන ඇත.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට 2023 අගෝස්තු/ සැප්තැම්බර් මාසවල දී ආයුර්වේද විශේෂඥ ක්ෂේත්‍ර පහක එහි පළමු වැනි විශේෂඥ වෛද්‍ය විභාගය අති සාර්ථක අන්දමින් පැවැත්වීමට හැකි වූ අතර පළමු ශිෂ්‍ය කණ්ඩායම 2024 ජනවාරි මාසයේ දී කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවයට සහභාගී කරවිය හැකි විය.

ආයතනය සිය අධ්‍යයන වැඩසටහන් සහ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් ඉහළ ගුණාත්මකභාවයක් පවත්වා ගැනීම වෙනුවෙන් අවශ්‍ය සෑම පියවරක්ම ගනු ලැබේ. ඒ අනුව අධ්‍යයන සහ අනධ්‍යයන කටයුතුවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා පසුගිය වර්ෂය තුළ දී අභ්‍යන්තර තත්ත්ව සහතික කුටිය ස්ථාපිත කරන ලදී. අභ්‍යන්තර තත්ත්ව සහතික කුටියේ කටයුතු ශක්තිමත් කරන අතරතුර දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ස්වයං ඇගයීම් වාර්තාව සඳහා අවශ්‍ය කරන ලේඛනමය සාක්ෂි භාරදීම හරහා කොළඹ විශ්වවිද්‍යාලයේ ආයතනික සමාලෝචනයට දායක වී ඇත. තව ද දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සහකාර පුස්තකාලයාධිපති ස්වයං ඇගයීම් වාර්තා කණ්ඩායමේ සාමාජිකයෙක්

ලෙස කටයුතු කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කේන්ද්‍රය මඟින් 2023 ජූලි මාසයේ දී පවත්වන ලද ආයතනික සමාලෝචනයේ දී කොළඹ විශ්වවිද්‍යාලය මුළු ලකුණු 84ක් ලබා ගනිමින් "A" ශ්‍රේණිගත කිරීමක් ලබා ඇත.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි පාර්ශ්වකරුවන් වෙනුවෙන් වඩාත් විශිෂ්ට සේවාවක් ලබා දීම පිණිස සමාජයේ අවශ්‍යතාවන් පිළිබඳව සෑමවිටම සැලකිලිමත් වේ. ඒ අනුව, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය දේශීය වෛද්‍ය අංශයේ සේවයේ නිරත වෛද්‍ය නිලධාරීන් අතර දේශීය වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් ඇති පශ්චාත් උපාධි පුහුණු අවශ්‍යතාවන් හඳුනා ගැනීම සඳහා විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුවේ ද සහයෝගය ඇතිව වෙළඳපොළ සමීක්ෂණයක් පැවැත්වීමට පියවර ගෙන ඇත.

උසස් අධ්‍යාපන ආයතනයක් තුළ පර්යේෂණ සංස්කෘතියක් ජනනය කිරීම දැනුම බෙදාහැරීම වෙනුවෙන් සිදු කළ හැකි ඉතා වැදගත් පියවරකි. පර්යේෂණ මඟින් විමසුම් මනසක් ගොඩනැගීමට අනුග්‍රහය දක්වන අතර නවෝත්පාදනයට, නිර්මාණශීලීත්වයට, විවක්ෂණ චින්තනයට සහ ගැටළු විසඳීමේ කුසලතා සංවර්ධනය කිරීමට මහපාදයි. උසස් අධ්‍යාපන පර්යේෂණ සහ පුද්ගලයින්ගේ සෞඛ්‍ය ඇතුළු ජාතියක සාමාජීය සුභසිද්ධිය අතර දැඩි සහ ධනාත්මක සබඳතාවක් පවතී. ඒ අනුව උසස් අධ්‍යාපන ආයතනවල සිදු කරන පර්යේෂණවල වැදගත්කම පිළිබඳව සලකා බලමින්, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් දේශීය වෛද්‍ය විද්‍යා අංශය සම්බන්ධයෙන් විවෘත ප්‍රවේශ සමියුරු සමාලෝචන වාරසභරාවක් දියත් කිරීමට සැලසුම් කර ඇත. සංස්කාරක කමිටුව මඟින් ඉදිරි වර්ෂයේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාරසභරාව දියත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් ඇත.

අන්තර්ජාතික සහයෝගීතාවන් ශිෂ්‍යයින්ගේ සහ ආයතනයේ ප්‍රගතිය උදෙසා වූ ඉඩප්‍රස්ථා රැසක් නිර්මාණය කර ඇත. පර්යේෂණ ක්ෂේත්‍ර, සායනික අත්හදාබැලීම් සහ විෂයමාලා සංවර්ධනය යනාදිය සම්බන්ධයෙන් ගවේෂණය කිරීමට ඔවුන්ට ඉඩදීම හරහා අධ්‍යාපන පද්ධතියේ ඇති වෙනස්කම් මඟින් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නංවයි. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් සහ දේශීය වෛද්‍ය ක්‍රමය උසස් අධ්‍යාපන අංශය තුළ ඉහළ මට්ටමකට ගෙන ඒම පිණිස දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් එහි අභ්‍යාසලාභීන් සඳහා වඩාත් ගුණාත්මක පුහුණුවක් සහ පර්යේෂණ අත්දැකීම් ලබා දීම සඳහා ඉන්දියානු පර්යේෂණ ආයතනක් සහ ඉන්දියාවේ ආයුෂ් අමාත්‍යාංශය සමඟ සහයෝගීතාවක් ඇති කර ගැනීමට පියවර ගෙන ඇත.

මේ අතර, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අභ්‍යාසලාභීන් උදෙසා වඩාත් හිතකර පරිසරයක් ලබා දීම පිණිස එහි යටිතලපහසුකම් ද සංවර්ධනය කරන ලදී. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය වඩාත් විධිමත් ක්‍රමවේදයක් යටතේ එහි අභ්‍යාසලාභීන් සඳහා ග්‍රන්ථ පරිශීලනය කිරීමේ සහ රැගෙනයාමේ පහසුකම් ලබා දී ඇත. පුස්තකාලයේ ග්‍රන්ථ එකතුව වැඩිදියුණු කිරීම පිණිස දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් 2024 වර්ෂයේ දී පුස්තකාල ග්‍රන්ථ මිල දී ගැනීම සඳහා අරමුදල් වෙන්කර ඇත.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි සියලුම මූල්‍ය කටයුතු සහ වාර්තා තබා ගැනීමේ ක්‍රියාවලි සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති (SLPSAS) පිළිපදිනු ලබයි. SLPSAS මඟින් ඉහළ ගුණාත්මක මූල්‍ය ප්‍රකාශන උත්පාදනය කිරීම ප්‍රවර්ධනය කිරීම, විධිමත් මූල්‍ය කළමනාකරණ ව්‍යවහාරවලට පහසුකම් සැලසීම, මූල්‍ය කාර්යසාධනය සහ තත්ත්වය පිළිබඳ නිවැරදිව නිරූපණය කිරීම සහ අවසානයේ දී වඩාත් නිවැරදි තීරණ ගැනීමක් පෝෂණය කිරීම සිදු කරන බැවින් මෙම කැපවීම ඉතා වැදගත් වේ. තව ද SLPSAS පිළිපැදීම මූල්‍ය වාර්තාකරණ ක්‍රමය තුළ ඒකාකාරීත්වයක් සහ තුලනාත්මකභාවයක් සහතික කරන අතර එමඟින් විනිවිදභාවය, වගවීම සහ පහපාලනය ප්‍රවර්ධනය කරයි. මෙම පාලන මූලධර්ම

කෙරෙහි ඇති ආයතනික කැපවීම පිළිබඳ සාක්ෂියක් ලෙස දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට එහි 2022 මූල්‍ය ප්‍රකාශන සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් හිමිවිය.

ආයතනයේ මානව සම්පත ශක්තිමත් කිරීම පිණිස දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් 2023 අගෝස්තු මාසයේ දී ඵලදායීතාව වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා හුරු පුහුණු වැඩසටහනක් සංවිධානය කර ඇත. පුහුණු වැඩසටහන්වල දී ලබා ගත් දැනුම ක්‍රියාත්මක කිරීම පිණිස දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් එහි පරිපාලන කටයුතු සඳහා ක්‍රියාවලි කාර්ය සංග්‍රහයක් සකස් කරමින් ඇත. කෙසේවුව ද, ප්‍රමාණවත් කාර්ය මණ්ඩල සාමාජිකයින් නොමැතිවීම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මුහුණ දී ඇති ප්‍රධාන ගැටළුවකි. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සමස්ත සේවක සංඛ්‍යාව 16ක් වුව ද වර්තමානයේ සිටින ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් ගණන 09ක් පමණි. ස්ථිර ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරයෙක් නොමැතිවීම 2023 වර්ෂය තුළ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය කටයුතු මෙහෙයවීම සම්බන්ධයෙන් බරපතල ගැටළු ඇති කළේය. එමෙන්ම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා වැඩ සහායකයින් නොමැතිවීම ද ආයතනයේ පරිපාලන සහ මූල්‍ය කටයුතුවල කාර්යක්ෂමතාවයට බලපෑමක් කර ඇත්තේ සියලුම අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ට වැඩ සහායකයින්ගේ කාර්යයන් ආවරණය කිරීමට සිදු වී ඇති බැවිනි. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා ස්ථිර වැඩ සහායකයින් බඳවා ගැනීම පිණිස මූලික පියවර ගෙන ඇත. වර්තමානයේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අනුයුක්තව සේවයේ නියැලි ස්ථිර කාර්ය මණ්ඩලය නිලධාරීන් 09 දෙනෙකි. බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන දෙපාර්තමේන්තුවෙන් වැඩ සහායක නිලධාරීන් දෙදෙනෙක් තාවකාලිකව අනුයුක්ත කළ ද ඔවුන්ට වෙනත් රාජ්‍ය ආයතනයක් මඟින් ස්ථිර රැකියා අවස්ථා පිරිනමා තිබූ බැවින් ඔවුන් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සේවයෙන් ඉවත් වී ඇත. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාර්ය මණ්ඩලය හිඟ වුව ද ඔවුන්ගේ දැඩි කැපවීම, කණ්ඩායම් වැඩ සහ එකමුතුකම මෙන්ම එහි ශිෂ්‍යයින් සහ සම්පත්දායකයින් අතර පවතින විශිෂ්ට සහයෝගය හේතුවෙන් ඔවුන්ට සිය ආයතනය වෙනුවෙන් වූ ඉහත සඳහන් කළ සියලුම කාර්යභාරයන් සාර්ථකව ඉටුකර ගැනීමට හැකිවිය.



Organizational Structure
Board of Management
Director
Administration Division
Finance Division
Library
Board of Study
Finance Committe
Audit committe
Library Committee
IT Committee
CDEC
CIC
SAR
SAB
Assistant Librarian
Specialty Board
Academic & Examination
Administration & Establishment
Clerical & Allied Grades
Clerical & Allied Grades
Clerical & Allied Grades
Clerical & Allied Grades
SAR- Senior Assistant Registrar
SAB -Senior Assistant Registrar
CIC – Committee for International Collaboration
CDEC - Curriculum Development Evaluation Committee

Figure - I

1.2 ආයතනයේ අධ්‍යක්ෂවරයා

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා ආයතනයේ අධ්‍යක්ෂවරයා වේ.

මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා 2023 වසරේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස සේවය කරන ලදී.

1.3 කළමනාකරණ මණ්ඩලය (BOM)

කළමනාකරණ මණ්ඩලය (BoM) දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රධාන විධායක සහ අධ්‍යයන මණ්ඩලය වන අතර සෑම මාසයක දීම එහි රැස්වීම් පවත්වනු ලැබේ. 2023 වර්ෂය තුළ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ (සාමාන්‍ය රැස්වීම් 08ක් සහ විශේෂ රැස්වීම් 01ක් ඇතුළුව) රැස්වීම් 09ක් පවත්වන ලදී.

රැස්වීම් අංක, දින සහ සහභාගීවීම් වාර්තා පහත දක්වා ඇත.

රැස්වීම් අංකය	**රැස්වීම් දිනය**	**සහභාගී වූ සාමාජිකයන් සංඛ්‍යාව**	**සහභාගී නොවීමට හේතු ඉදිරිපත් කළ සංඛ්‍යාව**	**සහභාගී නොවූ සංඛ්‍යාව**
35 වැනි රැස්වීම	20.01.2023	15	01	-
36 වැනි රැස්වීම	17.02.2023	12	03	01
3 වැනි රැස්වීම	17.03.2023	15	-	01
38 වැනි රැස්වීම	28.04.2023	10	01	03
39 වැනි රැස්වීම	19.05.2023	13	02	01
40 වැනි රැස්වීම	28.06.2023	13	03	01
41 වැනි රැස්වීම	15.09.2023	10	01	06
42 වැනි රැස්වීම	24.11.2023	12	03	02

වගුව - 1

සමාලෝචිත වර්ෂය තුළ දී පහත දැක්වෙන සාමාජිකයින් කළමනාකරණ මණ්ඩලයට ඇතුළත් විය.

නිල බලයෙන් පත් වන නිලධාරීන්
මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා — අධ්‍යක්ෂ – **PGIIM**

නම් කළ නිලධාරී/උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්
එම්. එච්. ටී. ටී. තුෂාරා මෙය

නම් කළ නිලධාරී/ දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්
යූ. එස්. කේ. දෙනාවත්ත මිය — 2023.05.19 සිට ක්‍රියාත්මක වන පරිදි
ගීතාමනී කරුනාරත්න මිය

නම් කළ නිලධාරී/ මුදල් අමාත්‍යාංශ ලේකම්
එච්. ඩී. ඩී. පී. කරුනාරත්න මිය — 2023.05.19 සිට ක්‍රියාත්මක වන පරිදි
ඊ. ඒ. රත්නසීල මහතා

ආයුර්වේද කොමසාරිස් ජනරාල්
වෛද්‍ය ධම්මික අබේගුණවර්ධන මහතා

කලින් හිටපු අධ්‍යක්ෂ
මහාචාර්ය ජයන්ත ජයවර්ධන මහතා

ප්‍රධානී, සිද්ධ වෛද්‍ය විද්‍යා අංශය, යාපනය විශ්වවිද්‍යාලය
වෛද්‍ය විවියන් සතියසීලන් මහත්මිය

ප්‍රධානී, සිද්ධ වෛද්‍ය විද්‍යා අංශය, ත්‍රිකුණාමලය මණ්ඩපය
වෛද්‍ය වී. අනවරතන් මහතා — 2023.05.19 දක්වා

අධ්‍යක්ෂ - බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය
වෛද්‍ය ස්වර්ණා කලුතොටගේ මිය-වැඩ බලන අධ්‍යක්ෂ**/BIMARI**

විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍ය (ආයුර්වේදය)
වෛද්‍ය ටී. කේ. ජී. පුංචිහේවා මිය

විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍ය (සිද්ධ)
වෛද්‍ය එස්. වර්ණකුලේන්ද්‍රන් මිය

විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍ය (යුනානි)
වෛද්‍ය ඒ. ජී. එෆ්. නජීයා මිය

වි.ප්‍ර.කො.ස. පත් කළ සාමාජිකින්
ටී. ධර්මරාජා මහතා
එස්. ඩී. ඩබ්. සමන් දියගහ වඩුගේ මහතා
කේ. කේ. සමින්ද ප්‍රියංග කෝණාර මහතා
වෛද්‍ය ඩබ්. ඒ. එල්. චන්ද්‍රසිරි වැලිවිට මහතා

පාලක සභාව නම් කළ නිලධාරීන්
මහින්ද මඩිහේවා මහතා — 2023.07.28 සිට ක්‍රියාත්මක වන පරිදි
චන්න ද සිල්වා මහතා — 2023.07.28 සිට ක්‍රියාත්මක වන පරිදි

1.4 මූල්‍ය කමිටුව

සමාලෝචිත වර්ෂය තුළ දී මූල්‍ය කමිටුවට පහත දැක්වෙන සාමාජිකයන් ඇතුළත් විය.

මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා	- අධ්‍යක්ෂ, PGIIM
මහාචාර්ය එම්. ඒ. ජේ. ඩබ්ලිව්. ජයවර්ධන මහතා	- කළමනාකරණ මණ්ඩල සාමාජික
ටී. ධර්මරාජා මහතා	- කළමනාකරණ මණ්ඩල සාමාජික
මහින්ද මඩිහේවා මහතා	- කළමනාකරණ මණ්ඩල සාමාජික

රැස්වීම් සංඛ්‍යාව, රැස්වීම් දින සහ සහභාගීවීම පිළිබඳ වාර්තා පහතින් දක්වා ඇත.

රැස්වීම් අංකය	**රැස්වීම් දිනය**	**සහභාගී වූ සාමාජිකයින් සංඛ්‍යාව**	**නොපැමිණෙන බවට දැනුම් දුන් සංඛ්‍යාව**	**නොපැමිණි සංඛ්‍යාව**
13th (2023/01)	07.02.2023	04	-	-
14th (2023/02)	30.03.2023	03	-	-
15th (2023/03)	17.07.2023	03	-	-
16th (2023/04)	01.11.2023	03	01	-
17th (2023/05)	19.12.2023	04	-	-

වගුව – 2

1.5 අධ්‍යයන මණ්ඩල

අධ්‍යයන කටයුතු, පුහුණු වැඩසටහන් සහ විභාග පිළිබඳ තීරණ කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලයේ සහ සනාතන සභාවේ අනුමැතියට යටත්ව, අධ්‍යයන මණ්ඩල (BOS) සහ විශේෂඥ මණ්ඩල (SpB) මඟින් ගනු ලැබේ. අධ්‍යයන මණ්ඩල (BOS) සහ විශේෂඥ මණ්ඩලවල රැස්වීම් මාසයකට වරක් පවත්වනු ලැබේ.

1.5.1 අධ්‍යයන මණ්ඩල

අධ්‍යයන මණ්ඩල ලැයිස්තුව

ආයුර්වේද අධ්‍යයන මණ්ඩලය
සිද්ධ අධ්‍යයන මණ්ඩලය
යුනානි අධ්‍යයන මණ්ඩලය

2023 වර්ෂයේ දී පවත්වන ලද අධ්‍යයන මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව

මණ්ඩලයේ නම	**පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව**
ආයුර්වේද	08
සිද්ධ	04
යුනානි	09

වගුව - 3

අධ්‍යයන මණ්ඩල සභාපතිවරු සහ ලේකම්වරු – 2023

අධ්‍යයන මණ්ඩලය	සභාපති	ලේකම්
ආයුර්වේද	මහාචාර්ය කේ. පී. පී. පීරිස් මිය (2023.05.10 සිට 2023.12.31 දක්වා) වෛද්‍ය එස්. ඩී. හපුආරච්චි මිය (2023.01.01 සිට 2023.05.09 දක්වා)	වෛද්‍ය බී. එම්. එස්. අමරජීව මිය (2023.05.10 සිට 2023.12.31 දක්වා) වෛද්‍ය පී. ආර්. වරාතැන්න මිය (2023.01.01 සිට 2023.05.09 දක්වා)
සිද්ධ	වෛද්‍ය එන්. වර්ණකුලේන්ද්‍රන් මයා	වෛද්‍ය කේ. සවුන්දරාජන් මිය
යුනානි	මහාචාර්ය එම්. එස්. එම්. ෂිෆා මහතා (2023.01.01 සිට 2023.04.05 දක්වා සහ 2023.07.12 සිට 2023.12.31 දක්වා) වෛද්‍ය එම්. එච්. එම්. හෆීල් මහතා – තාවකාලික සභාපති (2023.04.06 සිට 2023.07.11 දක්වා)	මහාචාර්ය එම්. යූ. ඉසෙඩ්. එන්. ෆර්සානා මිය

වගුව - 4

1.5.2 විශේෂඥ මණ්ඩල

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය තුළ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන විෂයන් සඳහා විශේෂඥ මණ්ඩල 12ක් ඇත.

විශේෂඥ මණ්ඩල ලැයිස්තුව

ආයුර්වේද
කෞමාරභෘත්‍ය පිළිබඳ විශේෂඥ මණ්ඩලය
කායචිකිත්සා පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ප්‍රසූතිතන්ත්‍ර ස්ත්‍රීරෝග පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ශල්‍යතන්ත්‍ර පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ස්වස්තවෘත පිළිබඳ විශේෂඥ මණ්ඩලය
භෛසජ්‍ය කල්පනා සහ රසශාස්ත්‍ර පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ශාලාක්‍යතන්ත්‍ර පිළිබඳ විශේෂඥ මණ්ඩලය

සිද්ධ
ගුණපාඩම් පිළිබඳ විශේෂඥ මණ්ඩලය
මරුතුවම් පිළිබඳ විශේෂඥ මණ්ඩලය

යුනානි
මෝලිජාත් පිළිබඳ විශේෂඥ මණ්ඩලය
ඉල්මුල් අද්වියා පිළිබඳ විශේෂඥ මණ්ඩලය
අම්රාස් ඊ නිස්වාන් වා කුවාබලාත් පිළිබඳ විශේෂඥ මණ්ඩලය

2023 වර්ෂයේ දී පවත්වන ලද විශේෂඥ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව

මණ්ඩලයේ නම	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව
ආයුර්වේද	
හෙසජ්‍ය කල්පනා සහ රසශාස්ත්‍ර	02
කෞමාරභෘත්‍ය	10
කායචිකිත්සා	10
ප්‍රසූතිතන්ත්‍ර ස්ත්‍රීරෝග	10
ශල්‍යතන්ත්‍ර	04
ස්වස්තවෘත	10
ශාලක්‍යතන්ත්‍ර	10
සිද්ධ	
ගුණපාඩම්	03
මරුතුවම්	03
යුනානි	
මෝලිජාත්	11
ඉල්මුල් අද්විය	01
අම්රාස් ඊ නිස්වාන් වා කුවාබලාත්	01

වගුව - 5

විශේෂඥ මණ්ඩලවල සභාපති සහ ලේකම් ධුරයන් – 2023

විශේෂඥ මණ්ඩලය	සභාපති	ලේකම්
ආයුර්වේද		
කෞමාරභෘත්‍ය	වෛද්‍ය අයි.ඒ.එම්. ලීනා මිය	වෛද්‍ය ඕ.ටී.එම්.ආර්.කේ.එස්.බී. කලවාන මිය
කායචිකිත්සා	වෛද්‍ය ටී. කේ. ජී. පුංචිහේවා මිය	වෛද්‍ය ඊ. ඩී. ටී. පී. ගුණරත්න මිය
ප්‍රසූතිතන්ත්‍ර ස්ත්‍රීරෝග	වෛද්‍ය කේ.පී.කේ.ආර්. කරුනාගොඩ මිය	වෛද්‍ය එච්. එල්. එම්. ජී. සංජීවනී මිය
ශල්‍යතන්ත්‍ර	වෛද්‍ය කේ. සී. පී. ගුණරත්න මිය	වෛද්‍ය කේ.කේ.වී.එස්. පේෂලා මිය
ස්වස්තවෘත	වෛද්‍ය ඩබ්. එම්. එස්. එස්. කේ. කුලතුංග මිය	වෛද්‍ය අයි. ඒ. එම්. ලීනා මිය
හෙසජ්‍ය කල්පනා සහ රසශාස්ත්‍ර	වෛද්‍ය එස්.කේ.එම්.කේ. හැරපත්දෙනිය මිය	වෛද්‍ය එම්. වී. ආර්. විජයන්තිමාලා මිය
ශාලක්‍යතන්ත්‍ර	මහාචාර්ය කේ. පී. පී. පීරිස් මිය	වෛද්‍ය ආර්. එල්. වයි. යූ. රත්නායක මිය
සිද්ධ		
ගුණපාඩම්	වෛද්‍ය වී. සතියසීලන් මිය	වෛද්‍ය කනගසුන්දරම් මහතා
මරුතුවම්	වෛද්‍ය ඒ. ශ්‍රීතරන් මිය	වෛද්‍ය එස්. වර්නකුලේන්ද්‍රන් මිය
යුනානි		
මෝලිජාත්	වෛද්‍ය එම්. එච්. එම්. හෆීල් මහතා	වෛද්‍ය ඒ. එල්. එම්. ඉෂාන් මහතා
ඉල්මුල් අද්විය	මහාචාර්ය එන්. ෆහාමියා මිය	වෛද්‍ය බී. අයි. නිහාරා මිය
අම්රාස් ඊ නිස්වාන් වා කුවාබලාත්	මහාචාර්ය එම්.යූ.ඉසෙඩ්.එන්. ෆර්සානා මිය	වෛද්‍ය ජේ. රුමිසියා මිය

වගුව - 6

1.6 පුස්තකාල කමිටුව

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා පුස්තකාලයක් ස්ථාපිත කිරීම සහ පුස්තකාල කටයුතු සඳහා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීම පිණිස 2021 වර්ෂයේ දී පුස්තකාල කමිටුවක් පිහිටුවන ලදී. 2023.12.31 වැනි දින විට පහත දැක්වෙන සාමාජිකයින් පුස්තකාල කමිටුවේ සේවය කරන ලදී.

කමිටුවට පහත දැක්වෙන සාමාජිකයින් ඇතුළත් වේ.

මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා - අධ්‍යක්ෂ / දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය- සභාපති

මහාචාර්ය ආර්. එස්. ජයවර්ධන මහතා - අධ්‍යයන මණ්ඩලයේ නියෝජිත/ ආයුර්වේද
වෛද්‍ය එම්. එස්. එස්. ෆවුමියා මිය- අධ්‍යයන මණ්ඩලයේ නියෝජිත /යුනානි
වෛද්‍ය ආර්. ඩී. ආනන්ද තිස්ස මහතා- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති - ගම්පහ වික්‍රමාරච්චි දේශීය

වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය

වෛද්‍ය සී. ආර්. ගමගේ මිය – ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති – දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
වෛද්‍ය දිල්හානි මුණසිංහ මිය - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති - වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
ලක්මිණී මාරසිංහ මිය- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති – වෛද්‍ය පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය

ඩී. ජී. ආර්. අයි. ගුණරත්න මහතා - සහකාර පුස්තකාලයාධිපති – දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
රැස්වීම් සංඛ්‍යාව, රැස්වීම් දින සහ සහභාගීවීම් වාර්තා පහත දක්වා ඇත.

රැස්වීම් සංඛ්‍යාව	**රැස්වීම් දිනය**	**සහභාගී වූ සාමාජිකයින් සංඛ්‍යාව**	**නොපැමිණීමට කරුණු ඉදිරිපත් කළ සංඛ්‍යාව**	**නොපැමිණි සංඛ්‍යාව**
6 වැනි රැස්වීම	12.01.2023	05	00	03
7 වැනි රැස්වීම	24.05.2023	04	02	01
8 වැනි රැස්වීම	24.10.2023	06	01	00

වගුව – 7

1.7 විෂයමාලා සංවර්ධන සහ ඇගයීම් කමිටුව (CDEC)

විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුව පහත දැක්වෙන කාර්යයන් ඉටුකරවා ගැනීම පිණිස 2020 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී.

- විෂයමාලා සංවර්ධනය ආරම්භ කිරීම, විෂයමාලා ඇගයීම සහ කළමනාකරණ මණ්ඩලයට විෂයමාලා නිර්දේශ කිරීම
- අධ්‍යයන කරුණු සහ විභාග සම්බන්ධ මාර්ගෝපදේශ සහ ලේඛන ඇගයීම සහ එම ලේඛන කළමනාකරණ මණ්ඩලයට නිර්දේශ කිරීම

කමිටුවට පහත දැක්වෙන සාමාජිකයින් ඇතුළත් වේ.

1. මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා(අධ්‍යක්ෂ)
2. මහාචාර්ය ප්‍රියානි පීරිස් මිය – මහාචාර්ය - ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය (සභාපති)
3. මහාචාර්ය ආර්. ඩී. එච්. කුලතුංග මිය – මහාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
4. වෛද්‍ය එස්. පී. මොල්ලිගොඩ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

5. වෛද්‍ය ඕ. ටී. එම්. ආර්. කේ. එස්. බී. කලවාන මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
6. වෛද්‍ය . කේ.කේ. වී. එස්. පේෂලා මිය - කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
7. වෛද්‍ය පුෂ්පා ජයකොඩි මිය- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය – ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය
8. වෛද්‍ය ඒ. එච්. ඒ. ෆසීනා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
9. වෛද්‍ය එන්. වර්නකුලේන්ද්‍රන් මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - ත්‍රිකුණාමලය මණ්ඩපය
10. මහාචාර්ය මාධව නිලුපති චන්ද්‍රතිලක මහතා- කැළණිය විශ්වවිද්‍යාලය
11. වෛද්‍ය වාසනා ජයරත්න මිය -වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ විශේෂඥ

විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුව මඟින් 2023 වර්ෂයේ දී පහත දැක්වෙන ලේඛන සකස් කර කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සහ පාලක සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී.

- වැඩසටහන් ඇගයීම් ක්‍රියාවලිය – (කාර්යසාධන වාර්තාව)
- මණ්ඩල සහතික කිරීම පිළිබඳ වරප්‍රසාද නිකුත් කිරීම සම්බන්ධ සංශෝධිත මාර්ගෝපදේශ
- අභ්‍යාසලාභීන් සඳහා පොදු රෙගුලාසි සහ මාර්ගෝපදේශ – 2023

ඉහත දක්වන ලද කාර්යයන්ට අමතරව විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුව දැනට පවත්වනු ලබන විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි වැඩසටහන්වල අභ්‍යාසලාභීන්ගේ ප්‍රතිපෝෂණය හඳුනා ගැනීම සඳහා එම වැඩසටහන් ඇගයීමේ දත්ත එකතු කිරීම පිණිස ප්‍රශ්නාවලියක් සකස් කිරීමේ කාර්යයයේ ද නිරත වන ලදී. දේශීය වෛද්‍ය අංශය පිළිබඳ පශ්චාත් උපාධි අවශ්‍යතාවන් හඳුනා ගැනීම ඉතා වැදගත් වන බැවින් විෂයමාලා සංවර්ධනය සහ ඇගයීම් කමිටුව 2023 වර්ෂයේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අවශ්‍යතා ඇගයීමක් පැවැත්වීම සිදු කරන ලදී. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහතික කිරීම පිණිස මෙම ක්‍රියාකාරකම් ඉතා වැදගත් වේ.

1.8 අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ කමිටුව (CIC)

අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ කමිටුව දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා අනෙකුත් රටවල් සමඟ සහයෝගීතාවන් ඇති කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කරවීමේ පරමාර්ථය ඇතිව ස්ථාපිත කරන ලදී. වර්තමානයේ සිටින විශේෂඥ වෛද්‍ය උපාධි හදාරන පුහුණුවන්නන්ගේ පශ්චාත් විශේෂඥ වෛද්‍ය උපාධි පුහුණුවීම් සඳහා ඉඩ ප්‍රස්ථා නිර්මාණය කිරීම කමිටුව ආරම්භයේ දී ඇති ප්‍රධාන ඉලක්කය වේ.

කමිටුවට පහත දැක්වෙන සාමාජිකයින් ඇතුළත් වේ.

1. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා (අධ්‍යක්ෂ)
2. වෛද්‍ය බී. එම්. එස්. අමරජීව මිය (සභාපති)
3. මහාචාර්ය ප්‍රියානි පීරිස් මිය - මහාචාර්ය – ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය
4. මහාචාර්ය ආර්. ඩී. එච්. කුලතුංග මිය - මහාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
5. වෛද්‍ය ටී. වීරරත්න මහතා
6. වෛද්‍ය කේ. පී. කේ. ආර්. කරුනාගොඩ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
7. වෛද්‍ය අයි. ඒ. එම්. ලීනා මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
8. වෛද්‍ය කේ. කේ. වී. එස්. පේෂලා මිය - කථිකාචාර්ය – දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ කමිටුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අභ්‍යාසලාභීන් සඳහා පුහුණු අවස්ථා ලබාදීම පිණිස දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ ඉන්දියාවේ ප්‍රමුඛ විශ්වවිද්‍යාල අතර සහයෝගීතාවන් ඇති කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව සහ ඉන්දියාවේ ආයුෂ් අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු සිදු කරනු ලබයි. මේ පිළිබඳ වූ යෝජනාව කෙටුම්පත් කරන ලද අතර එය කොළඹ විශ්වවිද්‍යාලයේ සනාථන සභාව සහ පාලක මණ්ඩලය මඟින් නිර්දේශ කර අනුමත කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ඉදිරි පියවර සඳහා ඉන්දියාවේ ආයුෂ් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා පවත්වයි.

1.9 අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කේන්ද්‍රය (IQAC)

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කේන්ද්‍රය (IQAC-PGIIM) රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා වූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2014 වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා මාර්ගෝපදේශවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකයේ නියෝග යටතේ 2022 වර්ෂයේ දී ස්ථාපිත කරනු ලැබීය. IQAC- PGIIM නිසි අධිකාරිය මඟින් අනුමත කර ඇති තත්ත්ව සහතික ප්‍රතිපත්ති රාමුව සහ අනු-නීති අනුගමනය කරනු ලබයි.

IQAC මඟින් උසස් ගුණාත්මක සේවාවක් ලබාදීම පිණිස අධ්‍යයන කාර්ය මණ්ඩලය, පරිපාලන කාර්ය මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින් ඇතුළු පාර්ශ්වකරුවන් රාශියකගේ සහභාගීත්වයෙන් ශක්තිමත් ආයතනයකි. ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටි සකස් කිරීම සහ ප්‍රගතිය අධීක්ෂණය කිරීම මඟින් ආයතනය පිරිනමන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ ප්‍රමිති සහතික කිරීම මෙම කුටියේ ප්‍රධානතම කාර්යභාරය වේ.

කමිටුවට පහත දැක්වෙන සාමාජිකයින් ඇතුළත් වේ.

1. මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා- අධ්‍යක්ෂ / දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
2. වෛද්‍ය බී. උතයනන් මිය– ත්‍රිකුණාමලය මණ්ඩපය (සම්බන්ධීකරණ නිලධාරී- IQAC/PGIIM)
3. මහාචාර්ය කේ. පී. පී. පීරිස් මිය - ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යා විශ්වවිද්‍යාලය
4. වෛද්‍ය අයි. ඒ. එම්. ලීනා මිය- දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
5. වෛද්‍ය වයි. ඒ. යූ. ඩී. කරුණාරත්න මිය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
6. වෛද්‍ය බී. එම්. එස්. අමරජීව මිය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
7. වෛද්‍ය ඩබ්. එම්. එස්. එස්. කේ. කුලතුංග මිය – දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
8. වෛද්‍ය කේ. කේ. වී. එස්. පේෂලා මිය– දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
9. මහාචාර්ය එම්. යූ. ඉසෙඩ්. එන්. ෆර්සානා මිය – දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
10. වෛද්‍ය එම්. එච්. එම්. හෆීල් මහතා – දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
11. මහාචාර්ය එන්. ෆහාමියා මිය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
12. වෛද්‍ය වී. සතියසීලන් මිය– යාපනය විශ්වවිද්‍යාලය
13. නදීෂා කරුණාරත්න මිය - දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජේ.ස.ලේ.
14. එස්. කේ. රුදිගු මහතා - දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජේ.ස.මූ.
15. ඩී. ජී. ආර්. එල්. ගුණරත්න මහතා - සහකාර පුස්තකාලයාධිපති (කැඳවුම්කරු/IQAC)

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් වශයෙන් 2023 වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ ආයතනික සමාලෝචනය සම්බන්ධයෙන් විස්තීරණ සමාලෝචනයකට භාජනය විය. මෙම සමාලෝචනයේ දී විචාරක මණ්ඩලයක් මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හඳුනා ගත් නිර්ණායක දහයක් ඔස්සේ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විවිධ අංශ ඇගයීමට ලක් කරන ලදී. එකී විචාරක මණ්ඩලය දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන හා පරිපාලන ක්‍රියාකාරකම් සහ ක්‍රියාවලි සම්බන්ධයෙන් මෙන්ම ශිෂ්‍යයන් වෙනුවෙන් ආයතනය තුළ පවතින අනුග්‍රාහක පරිසරය පිළිබඳව ද සෑහීමකට පත් වන ලදී. එමෙන්ම ඔවුන් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වැඩිදුර ප්‍රගතිය වෙනුවෙන් වූ නිර්දේශ කිහිපයක් ද ලබා දී ඇත.
විචාරක මණ්ඩලයේ නිර්දේශ දේශීය වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රය තුළ අධ්‍යාපනය පිළිබඳ උසස් ප්‍රමිතීන් පිළිපැදීම සඳහා වූ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නිරන්තර ව්‍යායාම වලංගු කිරීමක් ලෙස සැලකිය හැකිය.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි ශිෂ්‍යයින් සහ ප්‍රජාව වෙනුවෙන් වඩාත් විශිෂ්ට සේවාවක් ලබා දීම පිණිස එහි අධ්‍යයන වැඩසටහන් සහ පහසුකම් උසස් කිරීම සඳහා විචාරක මණ්ඩලය මඟින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කැපවී කටයුතු කරයි.

1.10 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාරසහරාවේ සංස්කාරක කමිටුව

විශ්වවිද්‍යාල යනු දැනුම නිර්මාණය කරන සහ දැනුම සම්ප්‍රේෂණය කරන දැනුම් කේන්ද්‍රස්ථාන ලෙස පොදුවේ සලකනු ලබන අතර විශ්වවිද්‍යාල දැනුම නිර්මාණය සහ බෙදාහැරීම සම්බන්ධයෙන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ආයුර්වේද ප්‍රතිකාර සහ සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව හරහා සෞඛ්‍යසම්පන්න ජාතියක් බිහි කිරීම සහතික කිරීමට අනාගත පරපුර වෙනුවෙන් සංස්කෘතික උරුමය සහ සාම්ප්‍රදායික දැනුම සුරක්ෂිත කිරීම ද ඇතුළත් වේ.

දේශීය වෛද්‍ය විද්‍යා අංශය පිළිබඳ පර්යේෂණ පැවැත්වීමේ වැදගත්කම සලකා බලමින්, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් දේශීය වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ නව පර්යේෂණ පැවැත්වීම සහ පළ කිරීම සඳහා ඉඩප්‍රස්ථා ලබා දීම සඳහා දේශීය වෛද්‍ය විද්‍යා අංශය සම්බන්ධයෙන් විවෘත ප්‍රවේශ සමීයුරු සමාලෝචන වාරසහරාවක් දියත් කිරීමට සැලසුම් කර ඇත. සංස්කාරක කමිටුව මඟින් ඉදිරි වර්ෂයේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාරසහරාව දියත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් ඇත.

කමිටුවට පහත දැක්වෙන සාමාජිකයින් ඇතුළත් වේ.

1. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මහතා - අධ්‍යක්ෂ / දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (ආරාධනය මත)
2. මහාචාර්ය පී. කේ. පෙරේරා මහතා – පීඨාධිපති, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
3. මහාචාර්ය ප්‍රියානි පීරිස් මිය- වෛද්‍ය පීඨය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය
4. මහාචාර්ය එස්. පී. මොල්ලිගොඩ මිය - වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
5. මහාචාර්ය එන්. ෆහාමියා මිය - වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
6. මහාචාර්ය ඩබ්ලිව්. ඒ. විරසූරිය - FSS, කැළණිය විශ්වවිද්‍යාලය
7. වෛද්‍ය ඩබ්ලිව්. ඒ. එස්. එස්. වීරකෝන් - වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
8. වෛද්‍ය එන්. නවලක්ෂ්මි මහත්මිය - සිද්ධ වෛද්‍ය විද්‍යා අංශය, යාපනය විශ්වවිද්‍යාලය
9. වෛද්‍ය බී. උතයනන් මහත්මිය - FSM, ත්‍රිකුණාමලය මණ්ඩපය
10. නිරාෂා ගුණරත්න මිය- වෛද්‍ය පීඨය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය
11. නිලූක ගුණතිලක මහතා - සෞඛ්‍ය අමාත්‍යාංශය
12. යසස්වි වල්පිට මහතා – වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

2. 2023 වර්ෂය තුළ අධ්‍යයන කටයුතු

2.1 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා ශිෂ්‍යයින් බඳවාගැනීම

2023 වර්ෂයේ දී විශේෂඥ වෛද්‍ය උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ පුහුණුවන්නන් පිළිබඳ විස්තර පහත දැක්වෙන වගුවෙන් විස්තර වේ.

අධ්‍යයන වැඩසටහන	පූර්ණ කාලීන/අර්ධ කාලීන	වෛද්‍ය විශාරද පාඨමාලා සඳහා ලියාපදිංචි වූ පුහුණුවන්නන් සංඛ්‍යාව (2023 දෙසැම්බර් 31 වැනි දිනට)		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව
වෛද්‍ය විශාරද ආයුර්වේද කෞමාරභෘත්‍ය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	-	-	-
වෛද්‍ය විශාරද ආයුර්වේද කායචිකිත්සා සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	-	-	-
වෛද්‍ය විශාරද ආයූර්වේද ප්‍රසූතිතන්ත්‍ර ස්ත්‍රීරෝග සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	-	02	02
වෛද්‍ය විශාරද ආයූර්වේද ශල්‍යතන්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	-	-	-
වෛද්‍ය විශාරද ආයූර්වේද ස්වස්තවෘත සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	-	-	-
වෛද්‍ය විශාරද යූනානි මෝලිජාත් සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	-	-	-
මුළු එකතුව		**-**	**02**	**02**

වගුව – 8

2.2 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුහුණුවන්නන් සංඛ්‍යාව

2023 දෙසැම්බර් 31 වැනි දිනට දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ඇතුළත් පුහුණුවන්නන්ගේ විස්තර පහත දැක්වෙන වගුවෙන් දැක්වේ.

අධ්‍යයන වැඩසටහන	පූර්ණ කාලීන/අර්ධ කාලීන	වෛද්‍ය විශාරද පාඨමාලා සඳහා ලියාපදිංචි වූ පුහුණුවන්නන් සංඛ්‍යාව (2023 දෙසැම්බර් 31 වැනි දිනට)		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව
වෛද්‍ය විශාරද ආයුර්වේද කෞමාරභෘත්‍ය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	-	02	02
වෛද්‍ය විශාරද ආයුර්වේද කායචිකිත්සා සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	-	02	02
වෛද්‍ය විශාරද ආයූර්වේද ප්‍රසූතිතන්ත්‍ර ස්ත්‍රීරෝග සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	-	04	04
වෛද්‍ය විශාරද ආයූර්වේද ශල්‍යතන්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	-	01	01
වෛද්‍ය විශාරද ආයූර්වේද ස්වස්තවෘත සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	-	-	-
වෛද්‍ය විශාරද යූනානි මෝලිජාත් සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	01	.01	02
මුළු එකතුව		**-**	**10**	**11**

වගුව – 9

2.3 දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරී පුහුණුවන්නන් සංඛ්‍යාව

ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරී වැඩසටහන දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් 2023 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. ආයුර්වේද විෂය ක්ෂේත්‍රයේ වෛද්‍ය විශාරද පශ්චාත් උපාධිධාරීන් 16 දෙනෙක් සහ ඉන්දියාවේ විශ්වවිද්‍යාලයවල සිද්ධ විෂය ක්ෂේත්‍රයේ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිධාරීන් දෙදෙනෙක් සමාලෝචිත වර්ෂය තුළ දී ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරී වැඩසටහන සඳහා ලියාපදිංචි වී ඇත.

2023 දෙසැම්බර් 31 වැනි දිනට දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිධාරී පුහුණුවන්නන් පිළිබඳ විස්තරය පහත දැක්වෙන වගුවෙන් දැක්වේ.

අධ්‍යයන වැඩසටහන	**පූර්ණ කාලීන/අර්ධ කාලීන**	**වෛද්‍ය විශාරද පාඨමාලා සඳහා ලියාපදිංචි වූ පුහුණුවන්නන් සංඛ්‍යාව (2023 දෙසැම්බර් 31 වැනි දිනට)**		
		පුරුෂ	**ස්ත්‍රී**	**එකතුව**
වෛද්‍ය විශාරද ආයුර්වේද කෞමාරභෘත්‍ය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	**01**	**01**	**02**
වෛද්‍ය විශාරද ආයුර්වේද කායචිකිත්සා සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	**04**	**04**	**08**
වෛද්‍ය විශාරද ආයුර්වේද ප්‍රසූතිතන්ත්‍ර ස්ත්‍රීරෝග සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	**-**	**02**	**02**
වෛද්‍ය විශාරද ආයුර්වේද ශල්‍යතන්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	**01**	**-**	**01**
වෛද්‍ය විශාරද ආයුර්වේද ස්වස්තවෘත සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	**-**	**03**	**03**
වෛද්‍ය විශාරද සිද්ධ මරුතුවම් සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	පූර්ණ කාලීන	**-**	**02**	**02**
මුළු එකතුව		**06**	**12**	**18**

වගුව – 10

2.4 විභාග ප්‍රතිඵල

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි පළමු වැනි විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි පරීක්ෂණය 2023 වර්ෂයේ දී පවත් වන ලද අතර පුහුණුවන්නන් 16 දෙනෙක් ආයුර්වේද විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධිධාරීන් ලෙස සමත් වූහ. 2023 අගෝස්තු/ සැප්තැම්බර් මාසවල දී පැවති විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි පරීක්ෂණවල ප්‍රතිඵල පහත දැක්වෙන වගුවේ දැක්වේ.

අධ්‍යයන වැඩසටහන	*ආයුර්වේද විශේෂඥ වෛද්‍ය උපාධි පරීක්ෂණය - අගෝස්තු/ සැප්තැම්බර් 2023*											
	අයැදුම් කළ සංඛ්‍යාව			මුහුණදුන් සංඛ්‍යාව			සමත් වූ සංඛ්‍යාව			අසමත් වූ සංඛ්‍යාව		
	පුරුෂ	කාන්තා	එකතුව	පුරුෂ	කාන්තා	එකතුව	පුරුෂ	කාන්තා	එකතුව	පුරුෂ	කාන්තා	එකතුව
වෛද්‍ය විශාරද ආයුර්වේද කෞමාරභෘත්‍ය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	01	01	02	01	01	02	01	01	02	-	-	-
වෛද්‍ය විශාරද ආයුර්වේද කායචිකිත්සා සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	05	07	12	04 *	07	11	04	04	08	-	03	03
වෛද්‍ය විශාරද ආයුර්වේද ප්‍රසූතිතන්ත්‍ර ස්ත්‍රීරෝග සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	-	02	02	-	02	02	-	02	02	-	-	-
වෛද්‍ය විශාරද ආයුර්වේද ශල්‍යතන්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	01	-	01	01	-	01	01	-	01	-	-	-
වෛද්‍ය විශාරද ආයුර්වේද ස්වස්තවෘත සහ අධ්‍යයන මණ්ඩල සහතිකය	-	03	03	-	03	03	-	03	03	-	-	-
මුළු එකතුව	**07**	**13**	**20**	**06**	**13**	**19**	**06**	**10**	**16**	-	**03**	**03**

***01 – මිය ගිය**

වගුව – 11

2.5 වෛද්‍ය විශාරද පශ්චාත් උපාධි වැඩසටහන් අනුමත කිරීම

දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය මඟින් පහත දැක්වෙන විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි වැඩසටහන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

1. වෛද්‍ය විශාරද ආයුර්වේද භෛසජ්‍ය කල්පනා සහ රසශාස්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
2. වෛද්‍ය විශාරද ආයුර්වේද ශාලාක්‍යතන්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
3. වෛද්‍ය විශාරද යුනානි ඉල්මුල් අද්වියා සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
4. වෛද්‍ය විශාරද යුනානි අම්රාස් ඊ නිස්වාන් වා කුවාබලාත් සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
5. වෛද්‍ය විශාරද සිද්ධ ගුණපාඩම් සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
6. වෛද්‍ය විශාරද සිද්ධ මරුතුවම් සහ අධ්‍යයන මණ්ඩල සහතිකය

2.6 වෛද්‍ය විශාරද ආයුර්වේද සහ අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වැඩසටහන්.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කටයුතු 2023 වර්ෂයේ දී අඛණ්ඩව සිදු කරන ලදී. සියලුම අභ්‍යාසලාභීන් ඔවුන් සඳහා වෙන් කළ පුහුණු මධ්‍යස්ථානවල දී විශේෂඥ වෛද්‍ය උපාධි පුහුණු වැඩසටහන්වලට සහභාගී වූහ. සමාලෝචිත වර්ෂයේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් පහත දැක්වෙන ආයුර්වේදය පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි සහ සහතිකකරණ වැඩසටහන් පවත්වන ලදී.

1. වෛද්‍ය විශාරද ආයුර්වේද කෞමාරභෘත්‍ය සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
2. වෛද්‍ය විශාරද ආයූර්වේද කායචිකිත්සා සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
3. වෛද්‍ය විශාරද ආයුර්වේද ප්‍රසූතිතන්ත්‍ර ස්ත්‍රීරෝග සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
4. වෛද්‍ය විශාරද ආයූර්වේද ශල්‍යතන්ත්‍ර සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
5. වෛද්‍ය විශාරද ආයූර්වේද ස්වස්තවෘත සහ අධ්‍යයන මණ්ඩල සහතිකය

2.7 වෛද්‍ය විශාරද යුනානි සහ අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වැඩසටහන්.

වෛද්‍ය විශාරද පශ්චාත් උපාධි වැඩසටහන් පිළිබඳ අනුමැතිය

කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සහ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය මත පහත දැක්වෙන යුනානි පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි වැඩසටහන් පිළිබඳ අයදුම්පත්‍ර දෙක විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කරන ලදී.

1. වෛද්‍ය විශාරද යුනානි ඉල්මුල් අද්වියා සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
2. වෛද්‍ය විශාරද යුනානි අමිරාස් ඊ නිස්වාන් වා කුවාබලාත් සහ අධ්‍යයන මණ්ඩල සහතිකය

2.8 වෛද්‍ය විශාරද සිද්ධ සහ අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වැඩසටහන්.

වෛද්‍ය විශාරද පශ්චාත් උපාධි වැඩසටහන් පිළිබඳ අනුමැතිය

කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සහ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය මත පහත දැක්වෙන සිද්ධ පිළිබඳ විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි වැඩසටහන් පිළිබඳ අයදුම්පත්‍ර දෙක 2020 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කරන ලද අතර මඟින් එම විශේෂඥ වෛද්‍ය පශ්චාත් උපාධි වැඩසටහන් ආරම්භ කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂා කරයි.

1. වෛද්‍ය විශාරද සිද්ධ ගුණපාඩම් සහ අධ්‍යයන මණ්ඩල සහතිකය
2. වෛද්‍ය විශාරද සිද්ධ මරුතුවම් සහ අධ්‍යයන මණ්ඩල සහතිකය

3. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන අංශ සහ පුස්තකාලය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන කටයුතු ප්‍රධාන වශයෙන් ආයතනයේ පරිපාලන අංශය සහ මූල්‍ය අංශය මඟින් සිදු කරනු ලැබේ. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය ද සාර්ථකව කටයුතු ඉටු කරමින් තිබේ.

3.1 පරිපාලන අංශය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන අංශය මඟින් සියලුම සාමාන්‍ය පරිපාලන කටයුතු සහ අධ්‍යයන කටයුතුවලට පහසුකම් සැලසීම පිළිබඳ ක්‍රියාකාරකම් පවත්වා ගෙන යනු ලැබේ. කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් සහ වෙනත් රැස්වීම් පැවැත්වීම සඳහා පරිපාලන සහයෝගය ලබාදීම, කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සහ පාලක සභාවේ මෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ලේඛන ඉදිරිපත් කිරීම, අධ්‍යයන වැඩසටහන් සහ ශිෂ්‍ය අවශ්‍යතාවන් සම්බන්ධ ලේඛන පිළිබඳව අදාළ බලධාරීන් සමඟ කටයුතු කිරීම සමාලෝචිත වර්ෂය තුළ දී පරිපාලන අංශය මඟින් අධ්‍යයන කටයුතු ආශ්‍රිතව ඉටු කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් විය.

මෙයට අමතරව, කාර්ය මණ්ඩලය බඳවා ගැනීම මඟින් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට මානව සම්පත් එකතු කර ගැනීම හා පෞද්ගලික ලිපි ගොනු කළමනාකරණය, අළුත්වැඩියා කටයුතු, ගොඩනැගිලි හා උපකරණ නඩත්තුව, කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් සඳහා පොදු සේවාවන් සැපයීම, සේවා ප්‍රසම්පාදනය හා සන්නිවේදන පහසුකම් සැපයීම සහ ප්‍රවාහන සේවාවන් සැපයීම පරිපාලන අංශය මඟින් ඉටු කරන පරිපාලන කටයුතු රාශිය අතර වේ. 2023 වර්ෂයේ දී පරිපාලන අංශයට එක් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරයෙක් සහ කළමනාකරණ සහකාර නිලධාරීන් 04 දෙනෙක් ඇතුළත් විය.

3.2 මූල්‍ය අංශය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය අංශය මූල්‍ය පරිපාලන ආශ්‍රිත කටයුතු ඉටු කරනු ලබන අතර අයිතම ප්‍රසම්පාදනය, වාර්ෂික, කාර්තුමය හා මාසික අයවැය සකස් කිරීම, මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තා අදාළ බලධාරීන්ට යැවීම, ආයතනය මඟින් ලබා ගන්නා සියලුම සේවා සඳහා ගෙවීම් සිදු කිරීම, සුළු මුදල් කළමනාකරණය, චෙක්පත් නිකුත් කිරීම, වැටුප් ගෙවීම ආදී කටයුතු දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය අංශය මඟින් කළමනාකරණ කරනු ලබන ප්‍රධාන කටයුතු අතර වේ.

මෙයට අමතරව, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා සියලුම පුනරාවර්තන හා ප්‍රාග්ධන අයිතම, ද්‍රව්‍ය, පොත්, වාරසඟරා ආදිය ප්‍රසම්පාදනය දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය අංශය මඟින් සිදු කරනු ලබයි. 2023 වර්ෂයේ දී මූල්‍ය අංශයට (වැඩ බැලීමේ පදනම මත) ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරයෙක් සහ ගණුන් තබන්නෙක් ඇතුළු කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනෙක් ඇතුළත් විය.
දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි සියලුම මූල්‍ය ක්‍රියාකාරකම් සහ ගිණුම්ගත කිරීමේ ක්‍රියාවලි සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) අනුගමනය කිරීමට කැපවී ඇත.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි සියලුම මූල්‍ය කටයුතු සහ වාර්තා තබා ගැනීමේ ක්‍රියාවලි සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති (SLPSAS) පිළිපදිනු ලබයි. SLPSAS මඟින් ඉහළ ගුණාත්මක මූල්‍ය ප්‍රකාශන උත්පාදනය කිරීම ප්‍රවර්ධනය කිරීම, විධිමත් මූල්‍ය කළමනාකරණ ව්‍යවහාරවලට පහසුකම් සැලසීම, මූල්‍ය කාර්යසාධනය සහ තත්ත්වය පිළිබඳ නිවැරදිව නිරූපණය කිරීම සහ අවසානයේ දී වඩාත් නිවැරදි තීරණ ගැනීමක් පෝෂණය කිරීම සිදු කරන බැවින් මෙම කැපවීම ඉතා වැදගත් වේ. තව ද SLPSAS පිළිපැදීම මූල්‍ය වාර්තාකරණ ක්‍රමය තුළ ඒකාකාරීත්වයක් සහ තුලනාත්මකභාවයක් සහතික කරන අතර එමඟින් විනිවිදභාවය, වගවීම සහ යහපාලනය ප්‍රවර්ධනය කරයි. මෙම පාලන මූලධර්ම කෙරෙහි ඇති ආයතනික කැපවීම පිළිබඳ සාක්ෂියක් ලෙස දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට එහි 2022 මූල්‍ය ප්‍රකාශන සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් හිමිවිය.

3.3 පුස්තකාලය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය 2022 නොවැම්බර් මස 01වැනි දින සිය දොරටු නිල වශයෙන් සිය පරිශීලකයින් සඳහා විවෘත කරන ලද අතර මාර්ගගත පුස්තකාල ප්‍රේරණ සැසියක් පවත්වන ලදී. ආයුර්වේදය සහ යුනානි පිළිබඳ ග්‍රන්ථ එක්රැස් කර ගැනීම මඟින් අපගේ පුස්තකාල පරිශීලකයින් සඳහා වඩාත් පුළුල් පුස්තකාල සහ තොරතුරු සේවා සැපයීම වෙනුවෙන් ග්‍රන්ථ එකතුව තවදුරටත් ව්‍යාප්ත කරමින් පවතී. 2022 වර්ෂයේ දී පුස්තකාලය සඳහා ග්‍රන්ථ 225ක් මිල දී ගන්නා ලදී. වර්තමානයේ දී මුද්‍රිත පොත් සහ ඉලෙක්ට්‍රොනික සම්පත් වශයෙන් පුස්තකාල සම්පත් ආකාර දෙකකට ලබා ගැනීමේ පහසුකම පවතී. අධ්‍යයන මණ්ඩලය සහ පුස්තකාල කමිටුව මඟින් සියලුම මුද්‍රිත ආයුර්වේදය සහ යුනානි ග්‍රන්ථ එකතුව අනුමත කරන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාලය දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විද්‍යුත් පුස්තකාල දත්තසමුදායන් හතරකට සම්බන්ධ කර ඇත. එමෙන්ම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය SLISTINET හි සාමාජිකත්වය දරයි. තව ද, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ පුස්තකාලය 2022 වර්ෂයේ දී අපගේ පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන්ට ඔවුන්ගේ පර්යේෂණ කාර්යයන් සඳහා පුස්තකාල පහසුකම් ලබා ගැනීමට ඉඩකඩ සලසා ඇත.

මේ වන විට දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය තුළ ඉතා හොඳින් සංවිධානගත කළ ග්‍රන්ථ එකතුවක් මෙන්ම කියැවීම් ශාලාවක් ද ඇත. කියැවීම් ඉඩකඩ අධ්‍යයන කටයුතු සඳහා පරිශීලනය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර වරකට ශිෂ්‍යයින් 10 – 15 අතර සංඛ්‍යාවකට පහසුකම් සලසයි. ශිෂ්‍යයින්ට සිය අධ්‍යයන කටයුතු සහ පර්යේෂණ කටයුතු සඳහා පුස්තකාලය තුළ දී පෞද්ගලික මෙවලම් භාවිතා කළ හැකිය. එමෙන්ම අධ්‍යයන කාර්යයන් වෙනුවෙන් පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන් සඳහා වයිෆයි අන්තර්ජාල පහසුකම් ද සපයා ඇත. පුස්තකාලයේ කියැවීම් පහසුකම්, ආලෝකකරණ පහසුකම් වැනි පහසුකම් ඉහළ නැංවීමට අවශ්‍ය පියවර ගනිමින් ඇත.

4. මානව සම්පත් දත්ත

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මුළු සේවක සංඛ්‍යාව දාසයකි. 2022 වර්ෂයේ දී පොත් තබන්නෙක් ඇතුළු කළමනාකරණ සහකාර නිලධාරීන් තනතුරු හයක පුරප්පාඩු සම්පූර්ණ කරන ලදී.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී සඳහා උසස්වීමක් හිමි වූ අතර වෙනත් ආයතනයක සේවයට අනුයුක්ත කරන ලදී. ඒ අනුව වෙනත් ආයතනයක සේවය කළ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරිවරයෙක් වැඩ බැලීමේ පදනම මත දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සේවය කරන ලදී.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අනුයුක්ත කරන ලද බහු-කාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩ සහායක නිලධාරීන් දෙදෙනා ස්ථිර රැකියා හිමිවීම හේතුවෙන් 2023 වර්ෂය තුළ දී සේවයෙන් ඉල්ලා අස්වන ලදී. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සුමට ක්‍රියාකාරීත්වය වෙනුවෙන් 2024 වර්ෂය තුළ දී පහත දැක්වෙන පුරප්පාඩු ඉක්මනින්ම සම්පූර්ණ කිරීමට අවශ්‍ය වේ.

- ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී – පුරප්පාඩු 01
- තාක්ෂණික නිලධාරී - පුරප්පාඩු 01
- වැඩසහායක - පුරප්පාඩු 02

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අලුතින් බඳවා ගත් අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා විශ්වවිද්‍යාල පරිපාලන පද්ධතිය පිළිබඳව දැනුවත්භාවය ලබාදීම පිණිස ප්‍රේරණ පුහුණු වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. 2023 අගෝස්තු මාසයේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සියලුම කාර්ය මණ්ඩලය සඳහා ඵලදායීතාව වැඩිදියුණු කිරීම පිළිබඳ (5S) වැඩසටහනක් පවත් වන ලදී. බන්තරමුල්ල පිහිටි ජාතික ඵලදායීතා සංවර්ධන ලේකම් කාර්යාලයේ සුගත් දසනායක මහතා මෙම පුහුණු සැසියේ සම්පත්දායකයා ලෙස කටයුතු කරන ලදී.

4.1 අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව සහ 2023 දෙසැම්බර් 31 වැනි දින වන විට සිටින කාර්ය මණ්ඩල සාමාජිකයින් පහත දැක්වෙන 9 වැනි වගුවේ දක්වා ඇත.

තනතුර	සේවය	ශ්‍රේණිය	වැටුප් කේතය	සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	සත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
වැඩ සහායක*	UWAS	III/II/I/ විශේෂ	U-PL 1	ප්‍රාථමික	02	0	02
රියැදුරු	UDS	III/II/I/ විශේෂ	U-PL 3	ප්‍රාථමික	03	0	03
කළමනාකරණ සහකාර (පොත් තැබීම)	UMAS	III/II/I	U-MN 1	ද්විතීය	01	01	0
කළමනාකරණ සහකාර	UMAS	III/II/I	U-MN 1	ද්විතීය	05	05	0
තාක්ෂණික නිලධාරී	UTS	III/II/I	U-MT 1	ද්විතීය	01	0	1
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	UA & FS	II/I	U-EX 2	ජ්‍යෙෂ්ඨ	01	0	1
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	UA & FS	II/I	U-EX 2	ජ්‍යෙෂ්ඨ	01	01	0
සහකාර පුස්තකාලයාධිපති	අධ්‍යයන		UAC 3	ජ්‍යෙෂ්ඨ	01	01	0
අධ්‍යක්ෂ	අධ්‍යයන		U-AC 5	ජ්‍යෙෂ්ඨ	01	01	0
එකතුව					**16**	**09**	**07**

*2022.08.30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුවේ සිට වැඩ සහායක නිලධාරීන් දෙදෙනෙක් අනුයුක්ත කරන ලද අතර ඔවුන් වෙනත් රජයේ ආයතනවල ස්ථිර පත්වීම් භාර ගැනීම වෙනුවෙන් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙන් ඉල්ලා අස්වූහ.

දෙවැනි කොටස

අවසාන ගිණුම් සහ විගණන තොරතුරු 2023

5. 2023 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

දෙසැම්බර් මස 31වැනි දිනට	සටහන අංකය	2023 රු.	2022 රු. (පුනප්‍රකාශිත)
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	3	8,747,112	13,166,716
ස්ථිර තැන්පතුවල ආයෝජනය	4	1,806,873	3,463,493
ලැබිය යුතු දෑ	5	614,443	741,378
කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම්	6	144,736	147,278
අත්තිකාරම්	7	14,794	2,284
භාණ්ඩ ලේඛන / තොග	8	471,657	489,723
මුළු ජංගම වත්කම්		11,799,615	18,010,871
ජංගම නොවන වත්කම්			
කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම්	6	306,323	461,922
දේපළ, පිරියත හා උපකරණ (ශුද්ධ)	9	8,140,790	8,084,459
අස්පෘශ්‍ය වත්කම්	10	47,192	60,192
මුළු ජංගම නොවන වත්කම්		8,494,305	8,606,573
මුළු වත්කම්		**20,293,920**	**26,617,444**
වගකීම්			
ජංගම වගකීම්			
උපචිත වියදම්	11	6,237,057	3,936,727
ගෙවිය යුතු දෑ	12	85,000	1,131,018
විලම්බිත ආදායම		1,433,333	1,358,333
විලම්බිත ආදායම PBC ගාස්තු		1,030,000	-
මුළු ජංගම වගකීම්		**8,785,390**	**6,426,078**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	13	1,871,018	1,565,030
මුළු ජංගම නොවන වගකීම්		1,871,018	1,565,030
මුළු වගකීම්		**10,656,407**	**7,991,108**
මුළු ශුද්ධ වත්කම්		**9,637,512**	**18,626,336**
සමුච්චිත සංචිත සහ අරමුදල්			
සමුච්චිත අරමුදල - ප්‍රාග්ධන	14	6,439,168	7,008,063
සමුච්චිත අරමුදල - පුනරාවර්තන	15	(4,410,810)	3,768,698
වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන	16-A	-	849,575
MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන	17	6,882,411	7,000,000
ප්‍රත්‍යාගණන සංචිතය		726,743	-
මුළු ශුද්ධ වත්කම්/හිමිකම		**9,637,512**	**18,626,336**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය නිකුත් කර ඇති රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව සකස් කර, ඉදිරිපත් කර ඇත.

.....	.....
	ඩබ්ලිව්.එන්.පී.එම්.එන්.එන්.
එස්. එම්. විතානාරච්චි	කරුණාරත්න
වැඩබලන ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකීම දරයි.

මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය මඟින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කර ඇත.

.....
මහාචාර්ය එස්. එම්. එස්. සමරකෝන්
අධ්‍යක්ෂ

.....	.....
ටී. ධර්මරාජා	එස්. ඩී. ඩබ්. සමන් දියගහ වඩුගේ
කළමනාකරණ මණ්ඩල සාමාජික	කළමනාකරණ මන්ඩල සාමාජික

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් අඩු කිරීම් දැක් වේ.

පිටු අංක 29 සිට 49 ක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කොටසකි.

- ඉංග්‍රීසි පිටපතෙහි අත්සන් සඳහන් කර ඇත.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

දෙසැම්බර් මස 31 වැනි දිනට	සටහන් අංකය	2023 රු.	2022 රු.
ආදායම			
හුවමාරු නොකළ ගනුදෙනුවලින් ආදායම - ජංගම			
ප්‍රනාරාවර්තන වියදම් සඳහා ආණ්ඩුවේ ප්‍රදානය		15,000,000	21,275,000
හුවමාරු නොවන ගනුදෙනුවලින් මුළු ආදායම -ජංගම		15,000,000	21,275,000
හුවමාරු ගනුදෙනුවලින් ආදායම - ජංගම			
උත්පාදික ආදායම	18	5,005,833	2,940,501
වෙනත් ආදායම	19	1,251,821	1,288,846
හුවමාරු ගනුදෙනුවලින් මුළු ආදායම - ජංගම		6,257,655	4,229,347
මුළු ආදායම - ජංගම		**21,257,655**	**25,504,347**
මෙහෙයුම් වියදම් -ජංගම			
වැටුප් හා වේතන	20-A	19,726,671	18,620,210
ගමන් සහ යැපීම් දීමනාව	20-B	28,158	26,820
සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ	20-C	643,482	1,153,917
නඩත්තු වියදම්	20-D	182,511	118,477
කොන්ත්‍රාත් සේවා	20-E	6,355,405	2,920,015
වෙනත් පුනරාවර්තන වියදම්	20-F	2,722,311	2,854,716
මුළු මෙහෙයුම් වියදම් - ජංගම		**29,658,537**	**25,694,155**
කාලපරිච්ඡේදය සඳහා ජංගම අතිරික්තය /(හිඟය)		**(8,400,883)**	**(189,809)**
හුවමාරු නොවන ගනුදෙනුවලින් ආදායම - ප්‍රාග්ධනය			
ප්‍රාග්ධන වියදම් සඳහා ආණ්ඩුවේ ප්‍රදාන		967,164	4,037,879
ත්‍යාග, ප්‍රදාන, ආකාරයේ භාණ්ඩ		33,869	
හුවමාරු නොවන ගනුදෙනුවලින් මුළු ආදායම -ප්‍රාග්ධනය		1,001,032	4,037,879
හුවමාරු ගනුදෙනුවලින් ආදායම- ප්‍රාග්ධනය		-	-
හුවමාරු ගනුදෙනුවලින් මුළු ආදායම -ප්‍රාග්ධනය		-	-
මුළු ආදායම –ප්‍රාග්ධනය		**1,001,032**	**4,037,879**
මෙහෙයුම් වියදම් - ප්‍රාග්ධනය			
ක්ෂයවීම්	20-G	1,556,927	1,206,424
ක්‍රමක්ෂය	20-H	13,000	4,808
මුළු මෙහෙයුම් වියදම් - ප්‍රාග්ධන		**1,569,927**	**1,211,232**
පරිච්ඡේදය සඳහා ප්‍රාග්ධන අතිරික්තය/(හිඟය)		**(568,895)**	**2,826,647**
පරිච්ඡේදය සඳහා මුළු අතිරික්තය/(හිඟය)		**(8,969,778)**	**2,636,838**
පරිච්ඡේදය සඳහා ජංගම අතිරික්තය/(හිඟය)		**(8,400,883)**	**(189,809)**
පරිච්ඡේදය සඳහා ප්‍රාග්ධන අතිරික්තය/(හිඟය)		**(568,895)**	**2,826,647**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය

සමකොටස්/ ශුද්ධ වත්කම්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය

2023 දෙසැම්බර් මස 31 වැනි දිනට

(විගණිත) **(රු.)**

	සමුච්චිත අරමුදල	වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදානය	වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදානය	MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදානය	**එකතුව**
2021 ජනවාරි මස 01වැනි දිනට ශේෂය	5,797,935	-	2,422,248	7,000,000	15,220,184
ප්‍රදාන ක්‍රමක්ෂය	-	-	-	-	-
ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන	-	-	3,000,000	-	3,000,000
වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	-	534,795	(534,795)	-	-
ආදායම් ප්‍රකාශනයට මාරු කිරීම	-	(534,795)		-	(534,795)
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය	1,786,068	-	-	-	1,786,068
2021 දෙසැම්බර් මස 31වැනි දිනට ශේෂය	**7,584,003**	**-**	**4,887,453**	**7,000,000**	**19,471,457**
ප්‍රදාන ක්‍රමක්ෂය	-	-	-	-	-
ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන	-	-	-	-	-
ගැලපීම්	555,919	-	-	-	555,919
වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	-	4,037,879	(4,037,879)	-	-
ආදායම් ප්‍රකාශයට මාරු කිරීම		(4,037,879)			(4,037,879)
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය	2,636,838				2,636,838
2022 දෙසැම්බර් මස 31වැනි දිනට ශේෂය	**10,776,760**	**-**	**849,575**	**7,000,000**	**18,626,336**

(පූනප්‍රකාශිත) **(රු.)**

	සමුච්චිත අරමුදල - ජංගම	සමුච්චිත අරමුදල - ප්‍රාග්ධනය	වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන	MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන	ප්‍රත්‍යාගණන සංචිතය	**එකතුව**
2021 ජනවාරි මස 01වැනි දිනට ශේෂය	1,281,259	4,516,677	2,422,248	7,000,000	-	15,220,184
ප්‍රදාන ක්‍රමක්ෂය						
ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන	-	-	3,000,000	-	-	3,000,000
වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	-	534,795	(534,795)	-	-	-
ආදායම් ප්‍රකාශයට මාරු කිරීම	-	(534,795)		-	-	(534,795)
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය	2,121,329	(335,261)	-	-	-	1,786,068
2021 දෙසැම්බර් මස 31වැනි දිනට ශේෂය	**3,402,588**	**4,181,416**	**4,887,453**	**7,000,000**	**-**	**19,471,457**
ප්‍රදාන ක්‍රමක්ෂය	-	-	-	-	-	-
ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන	-	-	-	-	-	-
ගැලපීම්	555,919	-	-	-	-	555,919
වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	-	4,037,879	(4,037,879)	-	-	-
ආදායම් ප්‍රකාශයට මාරු කිරීම	-	(4,037,879)	-	-	-	(4,037,879)
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය	(189,809)	2,826,647	-	-	-	2,636,838
2022 දෙසැම්බර් මස 31වැනි දිනට ශේෂය	**3,768,698**	**7,008,063**	**849,575**	**7,000,000**	**-**	**18,626,336**
වර්ෂය තුළ දී ලැබුනු ප්‍රාග්ධන ප්‍රදාන	-	-	-	-	-	-
ගැලපීම්	221,374	-	-	-	-	221,374
වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	-	967,164	(849,575)	(117,589)	-	-
ආදායම් ප්‍රකාශයට මාරු කිරීම	-	(967,164)	-	-	-	(967,164)
ප්‍රත්‍යාගණන අතිරික්තය	-	-	-	-	726,743	726,743
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය	(8,400,883)	(568,895)	-	-	-	(8,969,778)
2023 දෙසැම්බර් මස 31වැනි දිනට ශේෂය	**(4,410,810)**	**6,439,168**	**-**	**6,882,411**	**726,743**	**9,637,512**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා	**2023** **රු.**	**2022** **රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකයේ (භාවිතා කළ) මූල්‍ය ප්‍රවාහය		
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය	(8,969,778)	2,636,838
ගැලපීම්		
මූල්‍ය නොවන සංචලන		
දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම	1,556,927	1,206,424
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	13,000	4,808
පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම	305,987	59,726
ආයෝජනවලින් පොලී ආදායම	(1,229,035)	(1,268,949)
ප්‍රදාන ක්‍රමක්ෂය		
පෙර වර්ෂයේ සමුච්චිත වියදම් ප්‍රතිවර්තනය	220,835	555,919
වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන ආදායම් ගිණුමට මාරු කිරීම	(967,164)	(4,037,879)
ත්‍යාග, ප්‍රදාන, ආකාරයේ භාණ්ඩ	(33,869)	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය	**(9,103,097)**	**(843,112)**
බඩු තොගවල වැඩිවීම/ අඩුවීම	18,066	(26,172)
ජංගම වත්කම්වල වැඩිවීම/අඩුවීම	(25,466)	(227,559)
ජංගම වගකීම්වල වැඩිවීම / අඩුවීම	3,435,330	257,795
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	**(5,675,167)**	**(839,048)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් /(භාවිතා කළ) මූල්‍ය ප්‍රවාහ		
දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම	(1,928,125)	(3,156,128)
අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනීම	-	(65,000)
කාර්ය මණ්ඩලයට ණය ගෙවීම්	-	(543,034)
කාර්ය මණ්ඩලයෙන් ණය ආපසු අය කර ගැනීම්	158,141	268,001
ස්ථාවර තැන්පතු අස්කර ගැනීම	1,870,000	3,439,604
ස්ථිර තැන්පතුවල ආයෝජනය	(213,380)	(3,370,000)
අරමුදල් කළමනාකරණ ගිණුමෙන් පොලී ආදායම	1,368,927	1,035,565
ආයෝජන ක්‍රියාකාරකම්වලින් භාවිතා කළ ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	**1,255,563**	**(2,390,992)**
මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහ		
වසර සඳහා ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන		
මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	-	-
මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහ	**-**	**-**
මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම	(4,419,604)	(3,230,040)
වසර ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දේ	13,166,716	16,396,756
වසර අවසානයේ දී මුදල් හා මුදල් සමාන දේ	**8,747,112**	**13,166,716**
මුදල් හා මුදල් සමාන දේ:		
මුදල් සහ බැංකු ශේෂ (**සටහන** 3)	**8,747,112**	**13,166,716**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
මූල්‍ය සාධනයේ අයවැය සමඟ සංසන්දනාත්මක ප්‍රකාශනය

දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2023 තථ්‍ය රු.	2023 අයවැය රු.
ආදායම			
භාණ්ඩාගාරයෙන් ලැබුනු පුනරාවර්තන ප්‍රදාන		15,000,000	15,000,000
උත්පාදිත ආදායම	18	5,005,833	3,220,000
වෙනත් ආදායම	19	1,251,821	112,000
වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන මාරු කිරීම		967,164	-
මුළු ආදායම		**22,224,818**	**18,332,000**
මෙහෙයුම් වියදම්			
වැටුප් හා වේතන	20-A	19,726,671	22,161,000
ගමන් සහ යැපීම් දීමනාව	20-B	28,158	100,000
සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ	20-C	643,482	740,000
නඩත්තු වියදම්	20-D	182,511	250,000
කොන්ත්‍රාත් සේවා	20-E	6,355,405	6,000,000
වෙනත් පුනරාවර්තන වියදම්	20-F	2,722,311	3,167,000
ක්ෂයවීම	20-G	1,556,927	-
ක්‍රමක්ෂය	20-H	13,000	-
මුළු මෙහෙයුම් වියදම්		**31,228,465**	**32,418,000**
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)		**(9,003,647)**	**(14,086,000)**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2023 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා

1. සාමාන්‍ය තොරතුරු

1.1 නෛතික හා ආයතනික ස්ථාපනය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත 24 ඒ සමඟ කියවිය යුතු, 18 වැනි වගන්තිය යටතේ 2017 අංක 05 දරන නියමාවලිය මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිහිටුවන ලද අතර 2017 වර්ෂයේ අංක 2031/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. මෙම ආයතනය කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් වන අතර 2019 වර්ෂයේ පෙබරවාරි මාසයේ දී එහි නියමාවලියේ විස්තර කර ඇති කටයුතු ආරම්භ කරන ලදී. කාර්යාලය බොරැල්ල, කොටා පාරේ පිහිටි ආයුර්වේද ශික්ෂණ රෝහලේ 5වැනි මහලේ තාවකාලිකව ස්ථාපිත කර ඇත.
2023 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය, සමකොටස් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය 2024 පෙබරවාරි මස 21 වැනි දින පවත්වන ලද කළමනාකරණ මණ්ඩලය මඟින් අනුමත කර ඇත.

1.2 මූල්‍ය කාලපරිච්ඡේදය

ආයතනයේ මූල්‍ය කාලපරිච්ඡේදය 2023 ජනවාරි 01 වැනි දින සිට 2023 දෙසැම්බර් 31 වැනි දින දක්වා වේ.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුමේ ස්වභාවය

(අ) ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීම සහ ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව අනුමත කරනු ලබන පරිදි ආයුර්වේදය, යුනානි සහ සිද්ධ වෛද්‍ය විද්‍යා ක්‍රම සම්බන්ධ විශේෂඥ වෛද්‍ය ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි උපදෙස්, පුහුණුව සහ පර්යේෂණ සැලසීම.

(ආ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය සහ කොමිෂන් සභාවේ එකඟතාව ඇතිව ආයුර්වේදය, යුනානි සහ සිද්ධ වෛද්‍ය විද්‍යා ක්‍රම සම්බන්ධ විශේෂඥ වෛද්‍ය ක්ෂේත්‍රවල හෝ අදාළ විශේෂඥ විෂය ක්ෂේත්‍රවල ප්‍රදානය කරනු ලබන පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, පශ්චාත් උපාධි සහතිකපත්‍ර සහ අනෙකුත් ශාස්ත්‍රීය කුසලතා තීරණය කිරීම.

(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව ආයුර්වේදය, යුනානි සහ සිද්ධ වෛද්‍ය විද්‍යා ක්‍රම සම්බන්ධ විශේෂඥ වෛද්‍ය ක්ෂේත්‍රවල හෝ අදාළ විශේෂඥ විෂය ක්ෂේත්‍රවල ප්‍රවීණතාව අත්කර ගෙන ඇති තැනැත්තන් තීරණය කිරීමේ කාර්යය සඳහා විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව පශ්චාත් උපාධි විභාග පරීක්ෂණ පැවැත්වීම සහ විභාග සමත් වී ඇති සහ ආයතනයේ අදහස් විමසීමෙන් අනතුරුව විශ්වවිද්‍යාලය මඟින් අනු-නීතිවලින් නියම කරන අනෙකුත් කොන්දේසි සම්පූර්ණ කර ඇති තැනැත්තන් විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, පශ්චාත් උපාධි සහතිකපත්‍ර සහ අනෙකුත් ශාස්ත්‍රීය කුසලතා ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් සපුරාලන තැනැත්තන් පිළිබඳව විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම.
(ඈ) ගුරුවරුන්, ශිෂ්‍යයින් සහ විද්වතුන් හුවමාරු කර ගැනීමෙන් හෝ වෙනත් ආකාරයකින් ආයතනයට සමාන හෝ සැලකිය යුතු ලෙස සමාන අරමුණු ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි වෙනත් විශ්වවිද්‍යාල හෝ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

1.4 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ මූලධර්මය මත පදනම්ව සකසා ඇත.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

1.5.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලට (SLPSAS) අනුකූලව ඓතිහාසික පිරිවැය යටතේ පිළියෙළ කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන්වලින් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අදාළ කර ගත් ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

1.5.2 මිනුම් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇති අතර යෝගය අවස්ථා වලදී අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය හෙලිදරව් කිරීම් සිදු කර ඇත.

1.5.3 තුලනාත්මක තොරතුරු

වර්තමාන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සහ තුලනාත්මක බව වැඩි දියුණු කිරීම සහ තුලනාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල වාර්තා වී ඇති සියලු මුදල් සඳහා පෙර කාලපරිච්ඡේදයට සාපේක්ෂව තුලනාත්මක තොරතුරු අනාවරණය කරනු ලැබේ. 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල සමුච්චිත අරමුදලේ ඉදිරිපත් කිරීම් දෝෂ කිහිපයක් පැවතුනි. 2023 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින් එකී ඉදිරිපත් කිරීමේ දෝෂ නිවැරදි කර, තුලනාත්මක සංඛ්‍යාවන් ගලපන ලදී.

හුවමාරු නොකළ ගනුදෙනු හඳුනා ගැනීම සහ මැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අදාළ කර ගැනීම හේතුවෙන් ප්‍රාග්ධන ප්‍රදාන වියදම් කළ ගිණුම, MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන සහ සමුච්චිත අතිරික්තය/ හිඟය ගිණුම ගලපන ලද අතර පහත දැක්වෙන පරිදි ප්‍රකාශ කරන ලදී.

විස්තරය	වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම (රු.)	MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන (රු.)	සමුච්චිත අතිරික්තය/ හිඟය (රු.)	සමුච්චිත අරමුදල – ජංගම (රු.)	සමුච්චිත අරමුදල - ප්‍රාග්ධන (රු.)
2021.12.31 දිනට 2022 විගණිත ශේෂය	-	7,000,000	7,584,003	-	-
සමුච්චිත අරමුදලට මාරු කිරීම (SLPSAS-11 අනුව)	-	-	(7,584,003)	3,402,588	4,181,416
2022 වර්ෂයේ දී වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන මාරු කිරීම	(4,037,879)	-	-	-	4,037,879
31.12.2022 දිනට පුනප්‍රකාශිත ශේෂය	849,575	7,000,000	-	3,768,698	7,008,063

1.5.4 වැදගත්භාවය සහ සමූහනය

සමාන අයිතම සහිත ද්‍රව්‍ය මූල්‍ය ප්‍රකාශනවල වෙන්ව වර්ගීකරණය කර ඇති අතර නොසැලකිය යුතු තරම් කුඩා අසමානතා ඇති අවස්ථාවල හැර ස්වභාවයෙන් හෝ කාර්ය වශයෙන් අසමාන අයිතම වෙන් වෙන්ව දක්වා ඇත.

1.5.5 හිලව් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලින් ඉල්ලා සිටින විට හෝ අවසර දෙන අවස්ථාවල දී හැර වෙනත් කිසිම විටක වත්කම්, බැරකම්, අය සහ වැය හිලව් කර නැත.

1.5.6 වාර්තාකරන දිනයට පසු සිදුවීම්

වාර්තාකරන දිනයෙන් පසු සිදු වූ සියලුම සැලකිය යුතු අවස්ථා සැලකිල්ලට භාජනය කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය තැන්හි දී සුදුසු ගැලපීම් හා හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

1.5.7 කෘත්‍යාත්මක සහ ව්‍යවහාරික මුදල් ඒකකය

ආයතනයේ කෘත්‍යාත්මක සහ ව්‍යවහාරික මුදල් ඒකකය වන "ශ්‍රී ලංකා රුපියල්" (**රු.**) වලින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර, ඉදිරිපත් කර ඇත.

1.5.8 වටැයිම

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලින් වෙනත් අයුරකින් අවසර දී ඇත්නම් මිස මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මුදල් ප්‍රමාණ ආසන්න රුපියලට වටයා ඇත.

1.5.9 සුවිශේෂ ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණාත්මක විනිශ්චයන්වල සිදු වූ යම් වෙනස්කම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන්වල හෙළිදරව් කර ඇත.

2. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

2.1 ජංගම වත්කම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනයෙන් වර්ෂයක කාලයක් තුළ නැවත අය කරනු ලබන දේ වේ.

2.1.1 මුදල් සහ මුදල් සමාන දේ

මුදල් හා මුදල් සමාන දෑ අත ඇති මුදල්, බැංකු ශේෂය සහ කෙටි කාලීන ආයෝජනවලින් සමන්විත වේ.2019 වර්ෂයේ දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ප්‍රාග්ධන ප්‍රදානයක් ලෙස ලැබුනු **රු.**7,000,000.00 ක මුදල 2019 වර්ෂයේ දී අරමුදල් කළමනාකරණ ගිණුමට මාරු කරන ලද අතර ප්‍රවර්තන වර්ෂය තුළ උපයන ලද පොලිය **රු.** 737,923.00 ක් වේ.

2.1.2 ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම

2022 වර්ෂයේ දී රු. 500,000.00 බැගින් වූ ස්ථාවර තැන්පතු තුනක් අඛණ්ඩව නැවත අලුත් කිරීමේ පදනම මත මහජන බැංකු බොරැල්ල ශාඛාවේ නැවත ආයෝජනය කරන ලදී. මෙම ස්ථාවර තැන්පතු තුන 2023 වර්ෂයේ දී මෙම ප්‍රවර්තන වර්ෂය තුළ දී එම බැංකුවේම නැවත ආයෝජනය කරන ලදී. තව ද, කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිව ඇතිව 2023 දෙසැම්බර් 21 වැනි දින රු. 1,870,000.00 ක් ආපසු ලබා ගෙන ඇති අතර කල්පිරෙන අවස්ථාවේ දී රු. 384,040.36 ක් ලැබී ඇති අතර රු. 33,583.15 ක මුදලක් පොලිය වශයෙන් ලැබී ඇත.

2.1.3 භාණ්ඩ ලේඛන සහ තොග

බඩු තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි වටිනාකම අතර වඩා අඩු අගය මත පෙන්වා දී ඇත. පොදුවේ පිරිවැය පෙර පිවිසි පෙර නිකුත් පදනමක් මත ගණනය කරනු ලබන අතර එහි දී අදාළ තොග අත්පත් කර ගැනීමටත් ඒවා පවත්නා තත්ත්වයට පත්කරලීමට හා පවත්නා ස්ථානයට ගෙන ඒමටත් වැය වූ වියදම ඊට ඇතුළත් වේ.
ආයතනයේ බඩු තොගවලට ලිපිද්‍රව්‍ය සහ අනෙකුත් පරිභෝජන ද්‍රව්‍ය ඇතුළත් වේ.

2.2 ජංගම නොවන වත්කම්

2.2.1 දේපළ පිරියත හා උපකරණ

කාර්යාල හා ඉගැන්වීමේ උපකරණ, ගෘහභාණ්ඩ හා සවිකිරීම්, පරිගණක හා පරිගණක උපාංග, පුස්තකාල පොත් සහ වෙනත් වත්කම් රජයේ ප්‍රදානවලින් අත්පත් කර ගත් අයිතමවලට ඇතුළත් වේ.

තව ද, ගොඩනැගිල්ල ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් වන දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාර්යාල පරිශ්‍රය කොටස් කර, සිරස් තිරපටි සවි කිරීම සඳහා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය රු. 172,901.40ක් වැය කර ඇත. ගොඩනැගිල්ල දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අයත් නොවන බැවින් 2022 වර්ෂයේ දී මෙම මුදල සවිකිරීම් හා උපාංග ශීර්ෂය යටතේ ප්‍රාග්ධන වියදමක් ලෙස හඳුනා ගෙන ඇත. සාමාන්‍යයෙන් ගොඩනැගිලි 5%ක අනුපාතිකයෙන් වසර 20ක කාලපරිච්ඡේදයකට ක්ෂය කරනු ලැබේ. කෙසේවුව ද මෙම ගොඩනැගිල්ල දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට අයත් නොවන බැවින් මෙම සවිකිරීම් සහ උපාංග වියදම 10%ක අනුපාතය යටතේ වසර 10ක කාලපරිච්ඡේදයකට ක්ෂය කරනු ලැබේ.

කොළඹ විශ්වවිද්‍යාලය 2018 වර්ෂයේ දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුනු මූලික ප්‍රදාන උපයෝජනය කරමින් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා රු. 2,264,892.50ක් වටිනා වත්කම් ප්‍රසම්පාදනය කර ඇත. මෙම වත්කම් 2018 වර්ෂයේ දී කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාවල ඔවුන්ගේ වත්කම් ලෙස හඳුනා ගෙන ප්‍රාග්ධනීය කර ඇත. තව ද, කොළඹ විශ්වවිද්‍යාලය මඟින් 2018 වර්ෂය සඳහා සමුච්චිත ක්ෂය ලෙස රු.149,425.53ක් වූ අගයක් හඳුනා ගෙන ඇත. ඒ අනුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ඔවුන් ශුද්ධ ලිඛිත වටිනාකම පදනම්ව අතිරේක වශයෙන් රු. 2,115,466.97 ක් වටිනා වත්කම් 2019.01.01 දිනට හඳුනා ගෙන, ප්‍රාග්ධනීය කර ඇති අතර අදාළ ප්‍රදානය වත්කම්වල ඉතිරි ප්‍රයෝජනවත් කාලය තුළ ක්‍රමක්ෂය කර ඇත.

අ) හඳුනා ගැනීමේ සහ මැනීමේ පදනම

දේපළ, පිරියත හා උපකරණ වල අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන්නේ නම් සහ එහි පිරිවැය විශ්වාසනීයව මැනිය හැක්කේ නම් හඳුනා ගනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණ පිරිවැය අඩු කිරීම සමුච්චිත ක්ෂය අගයට වාර්තා කර ඇත. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය ඒවා මිලදී ගැනීමේ පිරිවැය සහ ඒවා සම්බන්ධ ආනුශංගික වියදම්වල එකතුව වේ.
සියලුම දේපළ, පිරියත හා උපකරණ මුලින් පිරිවැය මත ප්‍රකාශ කර ඇති අතර පසුව අඩු වශයෙන් සමුච්චිත ක්ෂයවීම් සහ යම් හානියක් සිදුවුවහොත් එය මනිනු ලැබේ. අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරනු ලබන පරිදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇත.

ආ) මූලික හඳුනා ගැනීම

වත්කම් ප්‍රාග්ධනිත කර ඇත්තේ ඒවායේ ස්වභාවය පදනම් කොට ගෙන වේ. වත්කම් ස්පෘශ්‍ය වන්නේ නම්, වසරකට වැඩි ආයු කාලයකින් හෙබි සහ සුවිශේෂී පිරිවැයක් ඇති නම් ඒවා ප්‍රාග්ධන වත්කම් ලෙස හඳුනා ගෙන ඇත. වත්කමක ආයු කාලය වර්ෂ 5 සිට 20 දක්වා එහි කාණ්ඩය අනුව රඳා පවති.

ඇ) හඳුනා ගැනීමෙන් පසුව මැනීම

පිරිවැය මොඩියුලය

සියල්ල හඳුනා ගැනීමෙන් පසුව දේපළ පිරියත සහ උපකරණ ඒවායේ පිරිවැය අඩු කිරීම සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීමෙන් ගලපන ලදී.

ප්‍රත්‍යාගණන මොඩියුලය

පහත දැක්වෙන මූලික දේපල පිරියත හා උපකරණ වර්ග හඳුනාගැනීමෙන් පසුව, සාධාරණ වටිනාකම විශ්වසනීයව මැනිය හැකි සාධාරණ වටිනාකම නැවත තක්සේරු කළ මුදලින් සිදු කරනු ලැබේ, එය නැවත ඇගයීමේ දිනයේදී සාධාරණ වටිනාකමක් වන අතර පසුව සමුච්චිත ක්ෂයවීම් සහ පසුව සිදුවන ඕනෑම හානියක් අඩු වේ. ආයතනය අභ්‍යන්තරව පත් කරන ලද කමිටුව හරහා පරිගණක සහ පරිගණක උපාංග නැවත ඇගයීමට ලක් කරන ලදී.

පරිගණක සහ පරිගණක උපාංග

ප්‍රත්‍යාගණනය කළ වත්කම්වලින් පැනනඟින ප්‍රත්‍යාගණනය කළ මුදල වන රු. 953,200.00 වත්කම් ලෙස හඳුනා ගෙන, අතිරික්තය රු. 726,743.46 ක මුදල ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කර, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සමුච්චිත අරමුදල සහ සංචිතයට ඇතුළත් කරන ලදී.

කිසියම් හානිකරණ අලාභයක් පිළිබඳ ඇගවීමක් තිබෙන්නේ දැයි තීරණය කිරීම පිණිස සෑම වාර්තාකරණ දිනයකදීම දේපළ පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල රැගෙන යාමේ අගය සමාලෝචනය කරනු ලබයි. එවැනි කිසියම් ඇගවීමක් තිබෙන්නේ නම්, එවිට වත්කමමේ ආපසු ලබා ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමේ රැගෙන යා හැකි අගය, එහි ආපසු අයකර ගත හැකි අගය ඉක්මවන්නේ නම්, හානිකරණ අලාභ හඳුනා ගැනේ.

ඈ) පවත්නා ස්ථාවර වත්කම් මත පසුකාලීන පිරිවැය

පහත දැක්වෙන නිර්ණායකයක් සම්පූර්ණ කරන්නේ නම් මිස, ස්පෘශය ස්ථාවර වත්කම් මත සිදු කරන ලද වියදම් එකී වියදම සිදු කළ කාලපරිච්ඡේදය තුළ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් කර දක්වා ඇති අතර එහි දී එය ප්‍රාග්ධනිත කර අදාළ පදනම මත ක්ෂය කරනු ලැබේ.

- ස්ථාවර වත්කම්වල වෙළඳපොළ වටිනාකම පසු කාලීනව ඉහළ ගොස් ඇත.
- වත්කම් ධාරිතාව ඉහළ ගොස් ඇත.
- නිමැවුමේ ගුණාත්මකභාවයේ තිරසාර වර්ධනයක් හෝ මෙහෙයුම් පිරිවැයේ අඩුවීමක්
- අළුත්වැඩියාවෙන් සහ නඩත්තුවෙන් ස්ථීර වන ප්‍රමාණයට ද වඩා සැලකිය යුතු අන්දමේ වත්කමේ කාලය දීර්ඝවීම.

ඉ) ක්ෂයවීම

මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ දේපළ පිරියත හා උපකරණ සඳහා ඒවා භාවිතය සඳහා ගන්නා ලද දිනයේ සිට ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය මත සරල මාර්ග ක්‍රමය යටතේ ගණනය කර ක්ෂය හඳුනා ගෙන ඇත. ඉඩම් ක්ෂය කර නොමැත. ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලයන් පහත දැක්වෙන පරිදි වේ.

විස්තරය	ඇස්තමේන්තුගත ඵලදායී ආයු කාලය
කාර්යාල හා ඉගෙනුම් උපකරණ	වර්ෂ 10
පරිගණක හා පරිගණක උපාංග	වර්ෂ 5
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	වර්ෂ 10
පුස්තකාල පොත්	වර්ෂ 5
සවිකිරීම් සහ උපාංග	වර්ෂ 10

භාවිතා කළ කාලය මත පදනම්ව, මිල දී ගත් දිනයේ සිට සහ අපහරණ දිනය දක්වා ක්ෂයවීම් ලබා දෙනු ඇත. කොළඹ විශ්වවිද්‍යාලයේ සිට මාරු කළ වත්කම් කොළඹ විශ්වවිද්‍යාලය මඟින් 2018 දෙසැම්බර් 31 දක්වා ක්ෂය කර ඇති බැවින් 2019.01.01 සිට ක්‍රියාත්මක වන පරිදි ක්ෂය කරනු ලැබේ.

2.2.2. අස්පෘශ්‍ය වත්කම්

සියලුම අස්පෘශ්‍ය වත්කම් සමුච්චිත ක්ෂයවලින් පිරිවැය සහ යම් හානිවීමක් අඩු කිරීමෙන් පසුව මූලිකව හඳුනා ගෙන ඇත.

අස්පෘශ්‍ය වත්කම් පිරිවැයට ඒවා මිල දී ගැනීමේ මිල ගණන් සහ එම වත්කම් අපේක්ෂිත ප්‍රයෝජනවත් භාවිතාවට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය ඇතුළත් වේ.

අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය වසර 05ක කාලයක් සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කර ඇත. තව ද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 20 අනුව අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂ කාලය එක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ දී සමාලෝචනය කරනු ලබන අතර කිසියම් වෙනස්කම් වෙතොත් ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් ලෙස ගණනය කරනු ලැබේ.

2.3 වගකීම් සහ ප්‍රතිපාදන

2.3.1 ජංගම වගකීම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනවල ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරන ලද වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයෙන් පසුව වර්ෂයක් ඇතුළත ගෙවීමට ඇති වගකීම් වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සියලුම දන්නා වගකීම් සැලකිල්ලට ගෙන ඇත.

2.3.2 විලම්බිත ආදායම

මාස කිහිපයක කාලයක් තුළ පාඨමාලා පවත්වන විට පාඨමාලා සහ අධ්‍යයන වැඩසටහන්වලට සම්බන්ධ අදාල ලැබීම් පාඨමාලා ආරම්භයේ දී එකතු කරන විට විලම්බිත ආදායම ඇති වේ. විලම්බිත ආදායම පාඨමාලාව ක්‍රියාත්මක වූ ප්‍රමාණය දක්වා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලබන අතර ඉතිරි පාඨමාලා කාලසීමාවට ආරෝපණය කළ හැකි ශේෂය ආදායම හඳුනා ගන්නා තෙක් මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ වගකීමක් ලෙස හඳුනා ගැනේ.

2.3.3 විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම

සේවක ප්‍රතිලාභ

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂිකය

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වලින් සියලුම සේවකයින් සිය විශ්‍රාමයේ දී ලැබෙන ප්‍රතිලාභවල අගය ඇස්තමේන්තු කරනු ලැබේ.

විශ්වවිද්‍යාලය 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ පාරිතෝෂික ගෙවීම යටතේ නියම කර ඇති ප්‍රතිලාභ සැලසුම සියලුම සුදුසුකම් සපුරා ඇති සේවකයින් සඳහා භාවිතා කර ඇත.

එය සාමාන්‍යයෙන් වයස, සේවා කාලය සහ වන්දි වැනි සාධක එකක් හෝ වැඩි ගණනක් මත රඳා පවතී. මෙම බැඳීම සම්පූර්ණ කිරීම පිණිස වාර්තාකරන දිනයට ප්‍රතිපාදනයක් ඉදිරියට ගෙන ගිය අතර අභ්‍යන්තර කළමනාකරණ ඇගයීමක් මත මුදල් අගය ගණනය කර ඇත. ඒ අනුව, වාර්තාකරන දිනයට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වසර 1ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා බැඳීම හඳුනා ගනු ලැබේ. කාලසීමාව ආරම්භයේ දී ඉදිරියට ගෙන යා ප්‍රතිපාදන සහ කාලසීමාව අවසානයේ දී ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදනය අතර වෙනස ලාභ අලාභ ප්‍රකාශනයේ දක්වා ඇත.

පාරිතෝෂික වගකීම සඳහා බාහිරව අරමුදල් සපයනු නොලබන අතර ආයුගණකව අගය කොට නොමැත.

(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම පසු සේවානියුක්ති සැලසුමක් වන අතර එක් ආයතනයක් මඟින් වෙනත් ආයතනයකට ස්ථාවර දායකත්වයක් ගෙවීමෙන් සිදු වන අතර වැඩිදුර මුදලක් ගෙවීම සඳහා නෛතික හෝ සම්ප්‍රයුක්ත බැඳියාවක් නොමැත. නිශ්චිත දායකත්ව සැලසුමට දායකත්වය දැක්වීම සඳහා වූ බැඳියාව එය ගෙවිය යුතු වන අවස්ථාවේ දී විස්තීර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනා ගෙන ඇත.

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (UPF) සහ විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල

ශ්‍රී ලංකාව තුළ අදාළ නීති සහ ව්‍යවස්ථා සහ විශ්වවිද්‍යාල පනතේ ප්‍රතිපාදන අනුව විශ්වවිද්‍යාලය සහ සේවකයින් සිය දළ වැටුප මත පදනම්ව පිළිවෙලින් 7% ක් සහ 10% බැගින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක වේ. තව ද, විශ්‍රාම වැටුප් හිමි සේවකයින් සඳහා විශ්වවිද්‍යාලය මඟින් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල සඳහා 8%ක් දායක වේ.

සේවක අර්ථසාධක අරමුදල (ETF)

විශ්වවිද්‍යාලය සෑම සේවකයෙක්ගේම දළ වැටුපෙන් 3%ක් සේවක භාරකාර අරමුදලට දායක වේ.

2.3.4 අසම්භාවය බැරකම්

නඩු පැවරීමෙන් පැන නගින වගකීම් සම්බන්ධයෙන් ගිණුම්වල ප්‍රතිපාදන නොමැත. 2023 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත මුළු වගකීම් ප්‍රමාණය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත.

2.4 සමකොටස්

2.4.1 ප්‍රාග්ධන ප්‍රදාන

ප්‍රදානය ලැබෙනු ඇති බවට සාධාරණ සහතිකයක් ලැබෙන අතර බලපාන සියලු කොන්දේසිවලට අනුකූල විය හැකි බවට සහතික විය හැකි අවස්ථාවල රජයේ ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකම්න් හඳුනා ගැනේ.

ස්ථාවර වත්කම් මිල දී ගැනීම සඳහා රජයේ ප්‍රදාන සහ වෙනත් ආයතනවලින් සිදු කළ දායකත්වයන් පළමු අවස්ථාවේදීම කලින් ලැබුනු ප්‍රදාන ලෙස හඳුනා ගනු ලැබේ. වත්කම් මිලදී ගැනීම සඳහා ප්‍රදාන උපයෝජනය කිරීම

මත ඒවා වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදානවලට ඇතුළත් කරන අතර ඒවා ප්‍රාග්ධනීයකරණය හෝ වියදම් කළ වත්කම් මිල දී ගැනීම සඳහා ආදායමට හෝ වියදමට ඇතුළත් කරනු ලැබේ.

2.4.2 පුනරාවර්තන ප්‍රදාන

පුනරාවර්තන ප්‍රදාන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මූදල් පදනම මත හඳුනා ගනී. වාර්තාකරන මූල්‍ය වර්ෂය තුළ ලැබූ පුනරාවර්තන ප්‍රදාන පහත දක්වා ඇත.

වර්ෂය	2023 (රු.)	2022 (රු.)
වැටුප් හා වේතන	15,000,000.00	17,475,000.00
වෙනත් පුනරාවර්තන	-	3,800,000.00
මුළු පුනරාවර්තන ප්‍රදානය	15,000,000.00	21,275,000.00

ප්‍රදාන ගිණුම්ගත කිරීම

විශ්වවිද්‍යාලය සිදු කළ වියදම් සඳහා දරනු ලබන ප්‍රදාන වියදම හඳුනා ගන්නා කාලය තුළ දීම ආදායම් ප්‍රකාශනයේ ආදායමක් ලෙස හඳුනා ගනී. වත්කමක පිරිවැය සඳහා විශ්වවිද්‍යාලය වැය කරන ප්‍රදාන අදාළ වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට ක්‍රමානුකූල පදනමක් මත ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනී.

ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්කරණය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් අංක 11 යොදා ගන්නා ලදී.

2019 වර්ෂය තුළ දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුනු මූලික ප්‍රාග්ධන ප්‍රදානය රු. 7,000,000.00ක් වූ අතර 2019 වාර්ෂික අයවැය අනුව භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රාග්ධන ප්‍රදානය රු. 6,100,000.00ක් විය. මෙම ප්‍රදාන දෙක 2019 ලැබුනු ප්‍රාග්ධන ප්‍රදාන ලෙස වෙන් වෙන්ව හඳුනා ගෙන ක්‍රමක්ෂය කරන ලදී.

මෙයට අමතරව, 2019 වර්ෂයේ දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් මාරු කළ වත්කම් මත පදනම්ව MOHEවලින් ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු. 2,115,466.97 ක් හඳුනා ගෙන, ඒ අනුව ක්‍රමක්ෂය කර ඇත.

තව ද ආයතනය මඟින් ශ්‍රීලරාගිප්‍ර 11 යොදා ගන්නා ලදී - හුවමාරු නොකළ ගනුදෙනුවලින් ආදායම 2022 සිට ඉදිරියට බලාත්මක වේ. ඒ අනුව, වියදම් කළ ප්‍රදාන, වියදම් නොකළ ප්‍රදානය, ත්‍යාග සහ ප්‍රදාන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ “සමුච්චිත අරමුදල - ප්‍රාග්ධනය” ලෙස එකතු කර ඇත. තව ද SLPSAS 11 අනුව පොදු සංචිත ගිණුම සමුච්චිත අරමුදල - ජංගම ලෙස නැවත නම් කරන ලදී.

වාර්තාකරණ මූල්‍ය වර්ෂය තුළ දී භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන ලැබී නොමැත.

2.5 විස්තීර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශනය

2.5.1 ආදායම හඳුනා ගැනීම

ගෙවීම් සිදු කළ දිනය නොසලකා, ආයතනය තුළට ආර්ථික වාසි ගලා ඒමේ හැකියාව, ආදායම විශ්වාසදායක ලෙස මැනිය හැකිවීම මත ආදායම හඳුනා ගනී. ආදායම හඳුනා ගැනීමට පෙර පහත දැක්වෙන නිශ්චිත හඳුනා ගැනීමේ නිර්ණායක ද සම්පූර්ණ කළ යුතු වේ.

01. පාඨමාලාවලින් ආදායම

විශේෂඥ වෛද්‍ය විද්‍යා උපාධි පාඨමාලාවලින් ලැබුනු ආදායම කලින් කළ සිදු වන පදනම මත ආදායම ලෙස හඳුනා ගනී. 2020 වර්ෂයේ දී විශේෂඥ වෛද්‍ය විද්‍යා උපාධි පාඨමාලා 5ක් ආරම්භ කර ඇති අතර 2022 වර්ෂයේ දී විශේෂඥ වෛද්‍ය විද්‍යා උපාධි පාඨමාලා 4ක් ආරම්භ කර ඇති. ලියාපදිංචි ගාස්තුව, පාඨමාලා ගාස්තුව සහ වෙනත් ගාස්තු ලෙස 2023 වර්ෂය තුළ දී ලැබුනු මුදල රු. 5,005,833.00 ක් වන අතර 2022 වර්ෂයේ දී උත්පාදිත ආදායම ලෙස හඳුනා ගෙන ඇති මුදල රු. 2,940,501.00 කි.

02. පොලී ආදායම

පොලී ආදායම උපචිත පදනම මත හඳුනා ගනී. පොලී ආදායමට ස්ථාවර තැන්පතු ආයෝජනවලින් ලැබිය යුතු පොලී ආදායම මෙන්ම අරමුදල් කළමනාකරණ ගිණුම්වලින් ලැබෙන පොලී ආදායම ඇතුළත් වේ.

03. වෙනත් ආදායම

ඉහත කාණ්ඩ යටතේ නිශ්චිතව දක්වා නොමැති වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

04. ත්‍යාග, ප්‍රදාන සහ ආකාරයේ භාණ්ඩ

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට නීති ප්‍රකාශකයින් - ඉන්දියාව, ජාතික විද්‍යා පදනම, වෛද්‍ය එම්. සී. එම්. මනීස් සහ වෛද්‍ය එම්. එල්. යූ. සල්මා ප්‍රදානය කළ පුස්තකාල ග්‍රන්ථ ලැබුනි. මේවායේ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලා එන හැකියාව මත, සහ වත්කමේ යුක්තිසහගත වටිනාකම විශ්වාසනීයව මැනිය හැකි පදනම මත ඒවා හුවමාරු කළ නොහැකි ආදායම - ප්‍රාග්ධනය ලෙස හඳුනා ගනී.

2.5.2 වියදම් හඳුනා ගැනීම

ආයතනයේ සියලුම කටයුතු සිදු කිරීමේ වියදම් උපචිත පදනම මත හඳුනා ගෙන ඇති අතර ඒවා සිදු වූ කාලසීමාව තුළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුළත් කෙරේ.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2019 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද අතර කාර්යාලය බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ 5වැනි මහලේ පිහිටුවා ඇත. ආරම්භයේ සිට මේ දක්වාම විදුලිය සහ ජලය සඳහා වූ බිල්පත් ආයුර්වේද ශික්ෂණ රෝහල මඟින් ගෙවා ඇත.

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් භාවිතා කරන කාර්යාලට සම්බන්ධ විදුලිය සහ ජල බිල්පත්වලට අදාළ මුදල් අගයන් 2022 අගෝස්තු මස අවසානය වන තෙක් ඉදිරිපත් කර නොතිබුනු බැවින් ඒවා ආයුර්වේද ශික්ෂණ රෝහල වෙත ආපසු ගෙවා නොමැත. 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය සඳහා පිළිවෙලින් ජලය සහ විදුලිය සඳහා රු.480,000.00 සහ රු. 1,230,000.00 බැගින් වෙන්කර ඇත (උපචිත වියදම් සඳහා වෙන්කිරීම්). කෙසේවුව ද, 2022 අගොස්තු මාසයේ දී 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය සඳහා පිළිවෙලින් ජලය සහ විදුලිය වෙනුවෙන් රු.42,643.80 සහ රු.3,739,324.38 ක් ගෙවීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව දැනුම් දී ඇත. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය කමිටුවේ දී මෙම කරුණ සාකච්ඡා කරන ලද අතර මාසික විදුලි ගාස්තු ගණනය කිරීම සඳහා භාවිතා කළ පදනම පිළිබඳව ආයුර්වේද දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමට තීරණය කරන ලදී. ආයුර්වේද දෙපාර්තමේන්තුව භාවිතා කළ පදනම සම්බන්ධයෙන් තාක්ෂණික දෝෂ ගණනාවක් ඇති බවට පෙනී යන බැවින් හිමිකම්පානු ලබන මුදල පිළිගත හැකි අගයක් දක්වා අඩු කර ගත හැකිය. ඒඅනුව 2022 වර්ෂය සඳහා ද විදුලිය සඳහා රු. 500,000.00ක් වෙන් කර ඇත.
කෙසේවුව ද, 2023 දෙසැම්බර් 31 වන විට:

ජල ගාස්තු:

- PGIIM 2019 සිට 2023 නොවැම්බර් දක්වා ජල ගාස්තු ගෙවා ඇත.
- 2023 දෙසැම්බර් මාසයේ ජලය සඳහා හිමිකම්පෑ මුදල වෙන්කර ඇත.

විදුලි ගාස්තු:

- විදුලිය පරිභෝජනය කිරීම පිළිබඳ ආයුර්වේද කොමසාරිස් සමඟ පැවති සාච්ඡා 2023 දෙසැම්බර් 31 වන විට ද සිදු කරමින් පවතින අතර තීරණයකට එළැඹී නොමැත.
- ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2022 අගොස්තු දිනැති ලිපිය මත පදනම්ව 2023 වර්ෂයේ දී විදුලිය සඳහා රු. 2,484,024.00 ක් වෙන් කර ඇත.

ආයුර්වේද දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා අවසාන කිරීමෙන් පසුව 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ විට විදුලිය සහ ජලය අධික හෝ හිඟ ප්‍රතිපාදන සඳහා ගැලපීම් සිදු කරනු ඇත.

2.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් 2ට අනුකූලව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් සකස් කර ඇති අතර එහි දී දළ මුදල් ලැබීම් සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල දළ මුදල් ගෙවීම් මූල්‍ය කටයුතු සහ ආයෝජන ක්‍රියාකාරකම් හඳුනා ගෙන ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් -11 (SLPSAS-11) 2022.01.01 සිට ක්‍රියාත්මක වන පරිදි භාණ්ඩාගාරයෙන් ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන හඳුනා ගැනීමට අදාළ කර ගෙන ඇත.

2.7 වගකීම් සහ අවිනිශ්චිතතා

දන්නා සියලුම වගකීම් ප්‍රමාණය තීරණය කිරීමේ දී සියලුම අවදානම් ගණන් ගනු ලැබේ. අවිනිශ්චිත වගකීම් යනු අවිනිශ්චිත අනාගත සිදුවීම් මත තීරණය වන හෝ ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීමේ සම්භාවිතාවක් නොමැති හෝ විශ්වාසදායක ලෙස මැනිය නොහැකි වත්මන් වගකීම් මඟින් පමණක් තහවුරු කළ හැකි බැඳීම් වේ. අවිනිශ්චිත වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා නොගන්නා නමුත් ඒවා දුරස්ථ නම් මිස අනාවරණය කරනු ලැබේ.

2.8 වාර්තාකරණ දිනයෙන් පසු සිදු වූ සිදුවීම්

වාර්තාකරණ දිනයෙන් පසු සිදු වූ සියලුම සැලකිය යුතු අවස්ථා සැලකිල්ලට භාජනය කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනයන්හි අවශ්‍ය තැන්වල දී සුදුසු ගැලපීම් සිදු කර ඇත.

කොළඹ විශ්වවිද්‍යාලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2023 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා

සටහන 03	**2023**	**2022**
මුදල් හා මුදල් සමාන දෑ	**රු.**	**රු.**
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0084061028 - පුනරාවර්තන	529,499	3,971,006
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0084060859 - ප්‍රාග්ධන	386,038	217,681
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 0085283375 - අරමුදල් කළමනාකරණ ගිණුම	7,582,575	8,978,030
BOC බොරැල්ල SG ගිණුම් අංක : 0092027342 - උත්පාදිත අරමුදල් පුනරාවර්තන	249,000	-
	8,747,112	**13,166,716**

සටහන 04	**2023**	**2022**
ස්ථාවර තැන්පතුවල ආයෝජන	**රු.**	**රු.**
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 86766165	-	-
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 86766175	-	-
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 86766156	-	-
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 88304410	-	-
BOC බොරැල්ල SG ගිණුම් අංකය: 89452154	-	1,870,000
මහජන බැංකුව බොරැල්ල ගිණුම් අංකය 078-6001-000014506-3	602,291	531,164
මහජන බැංකුව බොරැල්ල ගිණුම් අංකය 078-6001-000014505-4	602,291	531,164
මහජන බැංකුව බොරැල්ල ගිණුම් අංකය 078-6001-000014504-5	602,291	531,164
	1,806,873	**3,463,493**

සටහන 05	**2023**	**2022**
ලැබිය යුතු දෑ	**රු.**	**රු.**
පූර්ව ගෙවීම්	18,443	113,467
පාඨමාලා ගාස්තු ලැබීම්	100,000	416,668
ලැබිය යුතු Portfolio ඇගයීම් ගාස්තු	160,000	-
වාර්ෂික සමාලෝචන ඇගයීම් ගාස්තු ලැබිය යුතු	80,000	-
පර්යේෂණ යෝජනා ඇගයීම් ගාස්තු ලැබිය යුතු	240,000	-
පොලී ආදායම ලැබීම්	-	139,891
වෙනත් ලැබිය යුතු දෑ	16,000	71,351
	614,443	**741,378**

සටහන 06 කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම්	2024 අතරතුර දී ආපසු අය කර ගැනීම්	2024 පසුව ආපසු අය කර ගැනීම්	2023 රු.	2022 රු.
ආපදා ණය	123,570	275,063	398,633	534,560
පරිගණක ණය	12,000	26,500	38,500	49,500
වාහන ණය	7,466	-	7,466	16,640
කාර්ය මණ්ඩල ණය	1,700	4,760	6,460	8,500
	144,736	**306,323**	**451,059**	**609,200**

සටහන 07 අත්තිකාරම්	2023 රු.	2022 රු.
විවිධ අත්තිකාරම්	-	-
මුද්දර අග්‍රිමය	14,794	2,284
	14,794	**2,284**

සටහන 08 බඩු ලේඛන/ තොග	2023 රු.	2022 රු.
තොග	471,657	489,723
	471,657	**489,723**

සටහන 09
දේපළ පිරියත සහ උපකරණ

රු.

පිරිවැය

විස්තරය	01.01.2023 ශේෂය	2022ග්‍රන්ථ අධි තක්සේරු කිරීම ඉවත් කිරීම	එකතු කිරීම්	පරිත්‍යාග	බැහැර කිරීම්/ ගැලපීම්	31.12.2023 ශේෂය
කාර්යාල හා ඉගැන්වීම් උපකරණ	3,327,504		22,425			3,349,929
පරිගණක හා පරිගණක මෙවලම්	953,200		41,500			994,700
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	4,534,638		192,232			4,726,870
පුස්තකාල පොත්	2,161,382	(115,057)	711,006	33,869		2,791,200
සවිකිරීම් සහ උපාංග	172,901		-			172,901
එකතුව	**11,149,625**	**(115,057)**	**967,164**	**33,869**	**-**	**12,035,600**

ක්ෂයවීම් සඳහා වෙන්කිරීම්

විස්තරය	%	01.01.2023 ශේෂය	වර්ෂය සඳහා ගාස්තුව	අධි ක්ෂය ගාස්තු ඉවත් කිරීම 2022	බැහැර කිරීම්/ ගැලපීම්	31.12.2023ට ශේෂය
කාර්යාල හා ඉගැන්වීම් උපකරණ	10	980,132	339,516			1,319,648
පරිගණක හා පරිගණක මෙවලම්	20	-	193,445			193,445
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	10	1,139,341	454,830			1,594,171
පුස්තකාල පොත්	20	209,741	551,846	(539)		761,047
සවිකිරීම් සහ උපාංග	10	9,209	17,290			26,499
එකතුව		**2,338,422**	**1,556,927**	**(539)**	**-**	**3,894,810**

ලියා හල අගය

විස්තරය	01.01.2023ට ශේෂය	31.12.2023ට ශේෂය
කාර්යාල හා ඉගැන්වීම් උපකරණ	2,347,372	2,030,280
පරිගණක හා පරිගණක මෙවලම්	953,200	801,255
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	3,395,297	3,132,699
පුස්තකාල පොත්	1,951,642	2,030,152
සවිකිරීම් සහ උපාංග	163,693	146,403
එකතුව	**8,811,203**	**8,140,790**

සටහන 10

අස්පෘශය වත්කම්

රු.

පිරිවැය

විස්තරය	01.01.2023ට ශේෂය	එකතුකිරීම්	බැහැර කිරීම්/ ගැලපීම්	31.12.2023ට ශේෂය
වෙබ් අඩවිය සංවර්ධනය	65,000			65,000
එකතුව	**65,000**			**65,000**

ක්‍රමක්ෂය සඳහා වෙන් කිරීම්

විස්තරය	%	01.01.2023ට ශේෂය	වර්ෂය සඳහා ගාස්තුව	බැහැර කිරීම්/ ගැලපීම්	31.12.2023ට ශේෂය
වෙබ් අඩවිය සංවර්ධනය	20	4,808	13,000	-	17,808
එකතුව		**4,808**	**13,000**	**-**	**17,808**

ලියා හල අගය

විස්තරය	01.01.2023ට ශේෂය	31.12.2023ට ශේෂය
වෙබ් අඩවිය සංවර්ධනය	60,192	47,192
එකතුව	**60,192**	**47,192**

ජංගම නොවන වත්කම් පිළිබඳ සාරාංශය

විස්තරය	ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	පරිගණක	කාර්යාල හා ශික්ෂණ උපකරණ	පුස්තකාල පොත් හා වාරසඟරා	සවිකිරීම් සහ උපාංග	අස්පෘශය වත්කම්	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
2023 01 01 දිනට පිරිවැය/ප්‍රත්‍යාගණන ශේෂය	4,534,637.51	1,384,967.44	3,327,503.54	2,161,382.18	172,901.40	65,000.00	11,646,392.07
ප්‍රත්‍යාගණනය හේතුවෙන් වත්කම්වල පිරිවැය ඉවත් කිරීම		(1,384,967.44)					(1,384,967.44)
වත්කම් ප්‍රත්‍යාගණනය	-	953,200.00	-	-	-	-	953,200.00
එකතු කිරීම	192,232.49	41,500.00	-	744,875.00	22,425.00	-	1,001,032.49
බැහැරකිරීම්/ගැලපීම්	-	-	-	(115,057.00)	-	-	(115,057.00)
2023 12 31 දිනට NCA	4,726,870.00	994,700.00	3,327,503.54	2,791,200.18	195,326.40	65,000.00	11,840,273.72
ක්ෂයවීම් අනුපාතය	10%	20%	20%	20%	10%	20%	
2023 01 01 දිනයට සමුච්චිත ක්ෂයවීම්	1,139,341.00	1,158,510.90	980,132.00	209,741.00	9,209.00	4,808.00	3,501,741.90
වත්කම් පිටපත් කිරීම හේතුවෙන් ආරම්භක ශේෂයට ගැලපීම්	-	-	-	(539.00)	-	-	(539.00)
ප්‍රත්‍යාගණනය සඳහා සමුච්චිත ක්ෂයවීම් ප්‍රතිපාදන ඉවත් කිරීම	-	(1,158,510.90)	-	-	-	-	(1,158,510.90)
බැහැර කිරීම් සඳහා ක්ෂයවීම							-
2023 සඳහා ක්ෂය	454,830.19	193,444.66	339,516.39	551,846.11	17,290.14	13,000.00	1,569,927.49
2023 12 31 දිනයට සමුච්චිත ක්ෂය	1,594,171.19	193,444.66	1,319,648.39	761,048.11	26,499.14	17,808.00	3,912,619.49
WDV 31. 12. 2023	3,132,698.81	801,255.34	2,007,855.15	2,030,152.07	168,827.26	47,192.00	8,187,980.63
WDV 31. 12.2022	3,395,297.00	226,456.54	2,347,372.00	1,951,642.00	163,693.00	60,192.00	8,144,652.54

සටහන 11 **උපචිත වියදම්**	2023 රු.	2022 රු.
උපචිත විදයම් -පුනරාවර්තන	6,237,056	3,936,727
එකතුව	**6,237,056**	**3,936,727**

සටහන 12 **ගෙවිය යුතු දෑ**	2023 රු.	2022 රු.
ණයකරුවෝ	-	816,750
රඳවා ගැනීම්	-	259,268
ගෙවිය යුතු මුද්දර ගාස්තු	-	-
ගෙවිය යුතු රැස්වීම් දීමනාව	-	-
ගෙවිය යුතු පුස්තකාල ගාස්තු	75,000	55,000
පරිගණක විද්‍යාගාර ගාස්තු ආපසු ගෙවිය හැකි භාවිතය	10,000	-
එකතුව	**85,000**	**1,131,018**

සටහන 13 **විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ගෙවීම්**	2023 රු.	2022 රු.
ජනවාරි 01වැනි දිනට ශේෂය	1,565,030	1,505,304
වර්ෂය සඳහා ගාස්තුව	305,987	59,726
	1,871,018	1,565,030
වර්ෂය තුළ කළ ගෙවීම්	-	-
දෙසැම්බර් මස 31 වැනි දිනට ශේෂය	**1,871,018**	**1,565,030**

සටහන 14 **සමුච්චිත අරමුදල - ප්‍රාග්ධන**	2023 රු.	2022 රු.
ජනවාරි 01 වැනි දිනට ශේෂය	7,008,063	4,181,416
ගැලපීම් (පෙර වර්ෂය)	-	-
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)	(568,895)	2,826,647
දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය	**6,439,168**	**7,008,063**

සටහන 15 **සමුච්චිත අරමුදල - පුනරාවර්තන**	2023 රු.	2022 රු.
ජනවාරි 01 වැනි දිනට ශේෂය	3,768,698	3,402,588
ගැලපීම් (පෙර වර්ෂය)	221,374	555,919
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)	(8,400,883)	(189,809)
දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය	**(4,410,810)**	**3,768,698**

සටහන 16-අ **වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදානය**	2023 රු.	2022 රු.
ආරම්භක ශේෂය	849,575	4,887,453
වර්ෂය අතරතුර දී එකතු කිරීම්	-	-
මාරු කිරීම්	(849,575)	(4,037,879)
	-	**849,575**

සටහන 16-B **වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන**	2023 රු.	2022 රු.
ආරම්භක ශේෂය	-	-
මාරු කිරීම්	-	4,037,879
ගැලපීම්	-	-
ක්‍රමක්ෂය	-	(4,037,879)
	-	**-**

සටහන 17 **MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන**	2023 රු.	2022 රු.
ආරම්භක ශේෂය	7,000,000	8,047,199
ගැලපීම්	(151,457)	(1,047,199)
ක්‍රමක්ෂය	-	-
	6,848,543	**7,000,000**

සටහන 18 **උත්පාදිත ආදායම**	2023 රු.	2022 රු.
විශේෂඥ උපාධි ලියාපදිංචි ගාස්තුව	15,000	60,000
විශේෂඥ උපාධි පාඨමාලා ගාස්තුව	3,358,333	2,450,001
පරීක්ෂණ ගාස්තු	880,000	235,000
අධ්‍යයන මණ්ඩල සහතිකකරණ වරප්‍රසාද ගාස්තු	150,000	50,000
අයැදුම්පත්‍ර ගාස්තුව	3,000	33,500
පර්යේෂණ යෝජනා ඇගයීම් ගාස්තුව	300,000	90,000
පුස්තකාල ගාස්තුව (ආපසු ගෙවනු නොලබන)	8,000	22,000
පරිගණක විද්‍යාගාරය භාවිතා කිරීම (ආපසු ලබා නොදෙන)	4,000	-
වැඩමුළු ගාස්තු	47,500	-
පැනිකඩ ඇගයීම් ගාස්තුව	160,000	-
වාර්ෂික සමාලෝචන ඇගයීම් ගාස්තුව	80,000	-
එකතුව	**5,005,833**	**2,940,501**

සටහන 19 **වෙනත් ආදායම**	2023 රු.	2022 රු.
ණය හා අත්තිකාරම්වලින් පොලිය	22,786	16,117
අරමුදල් කළමණාකරණ ගිණුමෙන් පොලිය	737,923	923,457
ස්ථිර තැන්පතුවලින් පොලිය	491,112	345,492
වෙනත් ආදායම	-	3,780
එකතුව	**1,251,821**	**1,288,846**

මූළු වියදම

සටහන 20 -අ **පෞද්ගලික පාරිශ්‍රමික**	**2023** **රු.**	**2022** **රු.**
අධ්‍යයන		
වැටුප් හා වේතන	2,486,437	2,470,417
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	453,215	450,804
විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල	517,960	515,205
සේවක භාරකාර අරමුදල	194,235	193,202
අධ්‍යයන දීමනා	3,800,863	3,782,440
සංග්‍රහ දීමනා	217,260	217,260
වෙනත් දීමනා	787,310	101,000
බාහිර කථිකාචාර්ය ගාස්තු	979,700	447,600
පර්යේෂණ දීමනා	870,253	864,646
ජීවන වියදම් දීමනා	187,200	187,200
වැඩබැලීමේ ගාස්තු	-	-
අතිරේක දීමනා 20%	497,287	494,083
අතිරේක 5000 දීමනාව 2022	120,000	120,000
පාරිතෝෂිකය	21,412	2,444
එකතුව	**11,133,133**	**9,846,300**
අධ්‍යයන නොවන		
වැටුප් හා වේතන	3,591,103	4,279,160
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	371,712	359,392
විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදල	424,813	410,734
සේවක භාරකාර අරමුදල	192,395	154,025
වැඩබැලීමේ ගාස්තු	148,905	33,090
මාසික හිලව් දීමනාව	1,444,645	1,406,150
නිවාඩු ගෙවීම්	-	7,152
පාරිතෝෂිකය	284,575	57,283
අතිකාල	86,748	7,288
වෙනත් දීමනා	24,000	32,645
පර්යේෂණ දීමනා	307,378	412,099
ජීවන වියදම් දීමනා	655,200	603,242
අතිරේක දීමනා 20%	642,065	624,956
2022 අතිරේක දීමනා රු 5000	420,000	386,694
එකතුව	**8,593,539**	**8,773,910**
එකතුව	**19,726,671**	**18,620,210**

සටහන 20-ආ ගමන් වියදම් හා යැපීම් දීමනා	2023 රු.	2022 රු.
දේශීය	28,158	26,820
එකතුව	**28,158**	**26,820**

සටහන 20 - ඇ සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ	2023 රු.	2022 රු.
ලිපි ලේඛන හා කාර්යාල අවශ්‍යතා	450,592	427,019
ඉන්ධන හා ලිහිසි තෙල්	86,097	720,748
යාන්ත්‍රික හා විදුලි භාණ්ඩ	-	6,000
වෛද්‍ය සැපයුම්	-	-
වෙනත් සැපයුම්	106,793	150
එකතුව	**643,482**	**1,153,917**

සටහන 20 - ඈ නඩත්තු වියදම්	2023 රු.	2022 රු.
පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ	172,161	51,060
ගොඩනැගිලි හා ව්‍යූහය	10,350	67,417
එකතුව	**182,511**	**118,477**

සටහන 20 - ඉ කොන්ත්‍රාත් සේවා	2023 රු.	2022 රු.
විදුලිසංදේශ	185,281	174,955
තැපැල් ගාස්තු	44,920	33,127
විදුලිය	2,484,024	500,000
ආරක්ෂක සේවාව	440,149	274,961
ජලය	22,200	15,748
පිරිසිදු කිරීමේ සේවාව	459,391	342,370
කුලිය හා කුලී ගාස්තු	2,125,000	1,540,000
මුද්‍රණය හා දැන්වීම් ප්‍රචාරණය	594,439	38,856
එකතුව	**6,355,405**	**2,920,015**

සටහන 20 - ඊ වෙනත් පුනරාවර්තන වියදම්	2023 රු.	2022 රු.
විශේෂ සේවාව - පාලක සභාව හා කමිටු	1,367,580	1,909,319
වැඩමුළු හා සම්මන්ත්‍රණ	50,020	3,000
විශේෂ සේවාව - වෘත්තීය හා වෙනත් ගාස්තු	648,443	459,303
කාර්ය මණ්ඩල සංවර්ධනය හා පුහුණුව	3,079	44,070
දේපළ ණය මත පොලී සහනාධාරය	47,646	90,945
නිවාඩු බලපත්‍ර සහ වාරප්‍රවේශපත්‍ර	40,400	4,500
බැංකු ගාස්තු	67,213	4,425
දායකත්ව හා සාමාජික ගාස්තු	-	16,000
විභාග ගාස්තු	468,330	78,555
වෙනත්	29,601	244,600
එකතුව	**2,722,311**	**2,854,716**

සටහන 20 - උ ක්ෂයවීම්	2023 රු.	2022 රු.
ක්ෂය - කාර්යාල හා ඉගැන්වීමේ උපකරණ	339,516	332,161
ක්ෂය - ගෘහභාණ්ඩ හා සවිකිරීම්	454,830	360,353
ක්ෂය - පරිගණක හා පරිගණක මෙවලම්	193,445	294,960
ක්ෂය - පුස්තකාල පොත්	551,846	209,741
ක්ෂය - සවිකිරීම් සහ උපාංග	17,290	9,209
එකතුව	**1,556,927**	**1,206,424**


සටහන 20 - ඌ ක්‍රමක්ෂය - අස්පෘශ්‍ය වත්කම්	2023 රු.	2022 රු.
වෙබ් අඩවි සංවර්ධනය	13,000	4,808
එකතුව	**13,000**	**4,808**

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය		
කොළඹ විශ්වවිද්‍යාලය		
2023 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂ පිරික්සුම		
ක්තය සහ ගිණුමේ නම	**හර**	**බැර**
30010 - පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම		1,871,017.75
30100 - ණයහිමියෝ		-
30110 - සමුච්චිත වියදම් - පුනරාවර්තන		6,237,056.45
30120 - ගෙවිය යුතු මුද්දර ගාස්තු		-
30130 - රඳවා ගැනීම		-
30150 - ගෙවී යුතු රැස්වීම් දීමනාව		-
30160 - ක්ෂයවීම සඳහා වෙන්කිරීම කාර්යාල හා ශික්ෂණ උපකරණ		1,319,648.14
30170 - ක්ෂයවීම සඳහා වෙන්කිරීම පරිගණක හා පරිගණක උපාංග		193,444.66
30180 - ක්ෂයවීම සඳහා වෙන්කිරීම ගෘහභාණ්ඩ හා සවිකිරීම්		1,594,171.05
30181 - ක්ෂයවීම සඳහා වෙන්කිරීම පුස්තකාල පොත්		761,047.34
30182 - ක්ෂයවීම සඳහා වෙන්කිරීම සවිකිරීම් උපාංග		26,498.69
30183 - අස්පෘශය වත්කම් ක්‍රමක්ෂය		17,808.22
30190 - විලම්භිත ආදායම විශේෂඥ වෛද්‍ය පාඨමාලා ගාස්තුව		1,433,333.33
30195 - විලම්භිත ආදායම PBC ගාස්තුව		1,030,000.00
30200 - ආපසු ගෙවනු ලබන පුස්තකාල ගාස්තුව		75,000.00
30210 - පරිගණක විද්‍යාගාර භාවිතය (ආපසු ගෙවනු ලබන)		10,000.00
20050 - ගෘහභාණ්ඩ හා සවිකිරීම්	4,726,870.03	
20060 - කාර්යාල හා ශික්ෂණ උපකරණ	3,349,928.54	
20070 - පරිගණක හා පරිගණක උපාංග	994,700.00	
20090 - පුස්තකාල පොත්	2,791,199.60	
20100 - පරිගණක මෘදුකාංග	65,000.00	
20110 - සවිකිරීම් හා උපාංග	172,901.40	
20200 - බඩු ලේඛන	471,657.40	
20210 - ආපදා ණය	398,633.00	
20220 - ප්‍රවාහන ණය	7,466.00	
20230 - පරිගණක ණය	38,500.00	
20231 - කාර්ය මණ්ඩල ණය	6,460.00	
20235 - ලැබිය යුතු පොලී ආදායම	-	
20250 - BOC බොරැල්ල SG ගිණුම් අංකය 0084061028 - පුනරාවර්තනය	529,499.10	
20260 - BOC බොරැල්ල SG ගිණුම් අංකය 0084060859 - ප්‍රාග්ධනය	386,037.50	
20270 - BOC බොරැල්ල SG ගිණුම් අංකය 0085283375 - අරමුදල් කළමනාකරණ ගිණුම	7,582,574.95	
20275 - BOC බොරැල්ල SG ගිණුම් අංකය 0092027342 - උත්පාදිත අරමුදල් පුනරාවර්තන	249,000.00	
20280 - ස්ථාවර තැන්පතු ආයෝජනය - BOC බොරැල්ල SG	1,806,873.42	
20285 - මුද්දර අග්‍රිමය	14,793.50	
20295 - පූර්ව ගෙවීම	18,442.62	
20300 - ලැබිය යුතු පාඨමාලා ගාස්තු	100,000.00	
20320 - Portfolio ඇගයීම් ගාස්තු ලැබිය යුතු දේ	160,000.00	
20330 - වාර්ෂික ඇගයීම් ගාස්තු ලැබිය යුතු දේ	80,000.00	

20340 - පර්යේෂණ යෝජනා ඇගයීම් ගාස්තු ලැබිය යුතු දේ	240,000.00	
20310 - වෙනත් ලැබිය යුතු දේ	16,000.00	
10010 - වැටුප් හා වේතන	2,486,437.00	
10020 - විඅඅ (UPF)	453,215.03	
10030 - විශ්‍රාම වැටුප්	517,959.96	
10040 – සේඅඅ (ETF)	194,235.05	
10050 - වැඩබැලීමේ ගාස්තු	-	
10060 - අධ්‍යයන ගාස්තු	3,800,862.55	
10070 - අතිරේක ගාස්තු 2022	120,000.00	
10080 - බාහිර කථිකාචාර ගාස්තු	963,400.00	
10090 - ජීවන වියදම් දීමනාව	187,200.00	
10110 - වෙනත් දීමනා	787,310.15	
10120 - පාරිතෝෂිකය	21,412.45	
10130 - පර්යේෂණ දීමනාව	870,252.95	
10160 - 20% විශේෂ දීමනාව	497,287.40	
10180 - සංග්‍රහ දීමනාව	217,260.00	
10190 - දත්ත ගාස්තු	16,300.00	
10510 - වැටුප් හා වේතන	3,591,103.32	
10520 - විප්‍රඅ (UPF)	371,711.93	
10530 - විශ්‍රාම වැටුප	424,813.47	
10540 - සේඅර (ETF)	192,395.19	
10550 - වැඩබැලීමේ ගාස්තු	148,905.00	
10560 - අතිකාල ගෙවීම්	86,747.52	
10570 - නිවාඩු ගෙවීම්	-	
10580 - අතිරේක දීමනා 2022	420,000.00	
10590 - ජීවන වියදම් දීමනාව	655,200.00	
10610 -වෙනත් දීමනා	24,000.00	
10620 - පාරිතෝෂික	284,574.92	
10680 - පර්යේෂණ දීමනාව	307,377.68	
10650 - 20% විශේෂ දීමනාව	642,064.58	
10690 -45 % මාසික වන්දි දීමනාව	1,444,645.30	
11010 - දේශීය ගමන් වියදම්	28,157.54	
12010 - ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ	450,592.03	
12020 - ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය	86,096.59	
12070 - වෙනත්	106793	
13020 - පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ	172,160.73	
13030 - ගොඩනැගිලි හා ව්‍යුහයන්	10,350.00	
14020 - විදුලිසංදේශ	185,281.40	
14030 - තැපැල් ගාස්තු	44,920.00	
14040 - විදුලිය	2,484,024.00	
14050 - ආරක්ෂක සේවා	440,149.40	
14060 - ජලය	22,200.00	

14070 - පිරිසිදු කිරීමේ සේවා	459,391.24	
14080 - කුලී ගාස්තු	2,125,000.00	
14100 - මුද්‍රණය හා දැන්වීම් ප්‍රචාරණය ආදිය	594,438.65	
15020 - විශේෂ සේවා - පාලක සභාව හා කමිටු	1,367,580.00	
15030 - විශේෂ සේවා - වෘත්තීය හා වෙනත් ගාස්තු	648,443.13	
15040 - වැඩමුළු, සම්මන්ත්‍රණ	50,020.00	
15060 - කාර්ය මණ්ඩල සංවර්ධනය (පුහුණුව)	3,078.50	
15241 - දේපළ ණය මත පොලී සහනාධාරය	47,646.00	
15150 - නිවාඩු වාර ප්‍රවේශ ප්‍රත ගමන් බලපත්‍ර ටිකට්	40,400.00	
15170 - BOC පුනරාවර්තන - බැංකු ගාස්තු	67,212.82	
15190 - දායකත්ව සහ සාමාජික ගාස්තු	-	
15210 - විභාග ගාස්තු	468,330.00	
15230 - වෙනත්	29,601.00	
15240 - ක්ෂයවීම් - කාර්යාල හා ශික්ෂණ උපකරණ	339,516.39	
15250 - ක්ෂයවීම් - පරිගණක හා පරිගණක උපාංග	193,444.66	
15260 - ක්ෂයවීම් - ගෘහභාණ්ඩ හා සවිකිරීම්	454,830.19	
15270 - ක්ෂයවීම් - පුස්තකාල පොත්	551,846.11	
15280 - ක්ෂයවීම් - සවිකිරීම් හා උපාංග	17,290.14	
15290 - ක්‍රමක්ෂය - අස්පෘශ්‍ය වත්කම්	13,000.00	
40100 - භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන ප්‍රදාන		15,000,000.00
40120 - සමුච්චිත අරමුදල - ජංගම		10,998,135.04
40125 - සමුච්චිත අරමුදල - ප්‍රාග්ධන		967,163.55
40130 - ප්‍රත්‍යාගණන සංචිතය		726,743.46
40160 - MOHEවලින් ප්‍රාග්ධන ප්‍රදාන		6,882,411.11
40165 - පරිත්‍යාග - භාණ්ඩ වශයෙන් ලැබුනු		33,868.60
40170 - ණය හා අත්තිකාරම්වලින් පොලී ආදායම		22,786.03
40180 - අරමුදල් කළමනාකරණ ගිණුමෙන් පොලී ආදායම		737,922.89
40200 - ස්ථාවර තැන්පතුවලින් පොලී ආදායම		491,112.42
40300 - ලියාපදිංචි ගාස්තුව		15,000.00
40310 - පාඨමාලා ගාස්තුව		3,358,333.30
40320 - විභාග ගාස්තුව		880,000.00
40330 - මණ්ඩල සහතිකකරණ ගාස්තු වරප්‍රසාදය		150,000.00
40340 - අයදුම්පත්‍ර ගාස්තුව		3,000.00
40350 - පර්යේෂණ යෝජනා ඇගයීම් ගාස්තුව		300,000.00
40360 - පුස්තකාල ගාස්තුව (ආපසු ගෙවනු නොලබන)		8,000.00
40380 - පරිගණක විද්‍යාගාරය භාවිතා කිරීම (ආපසු ගෙවනු නොලබන)		4,000.00
40390 - වැඩමුළු ගාස්තුව		47,500.00
40370- වෙනත් ආදායම්		0.00
40400- පැතිකඩ ඇගයීම් ගාස්තුව		160,000.00
40410- වාර්ෂික සමාලෝචන ඇගයීම් ගාස්තුව		80,000.00
	55,435,002.03	**55,435,002.03**

6. විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/F/01/PGIIM/2022/FA/03 ඔබේ අංකය உமது இல.- Your No.

දිනය திகதி Date 2023 ජූනි 20 දින

POSTGRADUATE INSTITUTE OF INDIGENOUS MEDICINE Finance Division 17 JUL 2024 UNIVERSITY OF COLOMBO

POSTGRADUATE INSTITUTE OF INDIGENOUS MEDICINE Administration Division 16 JUL 2024 UNIVERSITY OF COLOMBO

POSTGRADUATE INSTITUTE OF INDIGENOUS MEDICINE 01 JUL 2024 UNIVERSITY OF COLOMBO

අධ්‍යක්ෂ,

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විභණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරනු ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගමට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව	විස්තරය
1971 අංක 38 දරන මුදල් පනතේ 11(අ) වගන්තිය	මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව ආයතනය විසින් 2023 දෙසැම්බර් 31 දිනට ඉපයූ රු.1,806,873 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) පශ්වාත් උපාධි විෂය මාලාවන් සඳහා පත්කර තිබුණු සිද්ධ අධ්‍යයන මණ්ඩල යටතේ කිසිදු පාඨමාලාවක් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබීම හේතුවෙන් පාඨමාලා පැවැත්වීමට නොහැකි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටු කිරීමට සැලසුම් කර තිබුණු ක්‍රියාකාරකම් 102 කින් පුහුණු කිරීම්, පර්යේෂණ හා පරිගණක පද්ධති සංවර්ධනය කිරීම සඳහා වූ ක්‍රියාකාරකම් 34 ක් ඉටු කිරීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

(ඇ) 2019 වර්ෂයේදී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.7,000,000ක මූලධන ප්‍රතිපාදන 2023 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනයකින් තොරව ඉතිරිකිරීමේ ගිණුමක රඳවා තිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 18 දිනැති අංක 2048/46 දරන ගැසට්පත්‍රය මඟින් ස්ථාපිත කර තිබුණු දේශීය වෛද්‍ය විද්‍යා පශ්වාත් උපාධි ආයතනය 2019 වර්ෂයේ සිට මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණද 2019 වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීමෙන් තොරව රු. 17,853,054 ක් වැය කර තිබුණි. 2020 හා 2022 වර්ෂ වලදී පිළිවෙලින් සිසුන් 20 දෙනෙක් හා සිසුන් 12 දෙනෙක් බඳවාගෙන එකතුව රු.63,466,524 ක් වැය කර තිබුණි. 2019 සිට 2023 කාලසීමාවට අදාළ අධ්‍යයන වර්ෂ 05 කින්, අධ්‍යයන වර්ෂ 03 කදී සිසුන් බඳවා නොගැනීම හේතුවෙන් ඒක ශිෂ්‍ය පිරිවැය රු. 676,843 ක සිට රු.1,130,204ක පරාසයක් ගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

7. විගණකාධිපති වාර්තාවට පිළිතුර

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

ඔබගේ අංක HED/F/01/PGIIM/2022/FA/03 හා 2023 ජූනි 20 දින දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක විගණකාධිපති වාර්තාවට අදාළ පැහැදිලි කිරීම් පහත ඉදිරිපත් කෙරේ.

2.2.2. මුදල් කමිටු නිර්දේශය මත කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය අනුව රු.250,000 ක ආරම්භක තැන්පතුවකින් මෙම ඉපැයූ ආදායම් ගිණුම් ආරම්භ කරන ලදී. එමෙන්ම 2021 තෙක් ඉපයූ ආදායම් රු.500,000 බැවින් වූ ස්ථාවර තැම්පතු-ගිණුම් 03 ක් ආයතනයේ නමින් පවත්වාගෙන යනු ලබන අතර 2023.12.31 වන විට එහි ශේෂය 1,806,873 ක මුදලක් බවට පත්ව ඇත.

මෙම ස්ථාවර තැන්පතු ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත විශ්වවිද්‍යාල කොමිෂන් සභාව සහ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අනුමත කර භාණ්ඩාගාරය වෙත යොමු කර ඇති අතර විශ්වවිද්‍යාල කොමිෂන් සභාව සහ අධ්‍යාපන එම ලිපිය ජාතික අයවැය දෙපාර්මේන්තුව වෙත යොමු කර ඇත.

2.3 වෙනත් කරුණු

(අ) සිද්ධ මරුතුවම් සිද්ධ ගුණපාඩම් යන පාඨමාලා වල අනුමැතියෙන් ලබා ගැනීම පිණිස අදාල අයදුම්පත් කොළඹ විශ්වවිද්‍යාලයීය තත්ත්ව ආරක්ෂණ කේන්ද්‍ර හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමුකර පැවතියද එම පාඨමාලා සඳහා තවමත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලැබී නැත. මේ සම්බන්ධව කොළඹ විශ්වවිද්‍යාලයීය තත්ත්ව ආරක්ෂණ කේන්ද්‍රය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වරින්වර පෙන්වා දෙනු ලැබූ වෙනස්කම් ආයතනය විසින් සකස් කර ඉදිරිපත් කලද මේ වනතෙක් අනුමැතිය ලැබී නැත.

(ආ) ඉලක්ක 5ක් මුල් කර ගනිමින් ආයතනයේ ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත. කෙසේ නමුත් හඳුනාගෙන ඇති ක්‍රියාකාරකම් අතුරින් ඇතැම් ක්‍රියාකාරකම් 2023 වසරේදී නිම කළ නොහැකි වීමට ප්‍රධාන වශයෙන් 2023 වර්ෂයදී ආයතනයට ප්‍රාග්ධන හෝ පුනරාවර්ථන වියදම් (වැටුප් සඳහා පමණක් මුදල් වෙන් කර තිබුණි) ලෙස කිසිදු මුදලක් නොලැබීම හේතු විය. මීට අමතරව වෙනත් හේතු ලෙස නව පාඨමාලා ආරම්භ කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය නොලැබීම, සේවක හිඟය හා නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කළමණාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොලැබීම හේතුවිය.

(ඇ) 2019 දී අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් ලැබුණු රු.මිලියන 7 ප්‍රදානය, 2022 වර්ෂය වන තෙක් PGIIM ආයතනයට අත්‍යවශ්‍ය වූ මෝටර් රථයක් මිලදී ගැනීමට අවශ්‍ය අනුමැතින් ලබා ගැනීමේ අරමුණින් උපයෝජනය නොවිණි. නමුත් රටේ පැවති විවිධ අස්ථාවරකම් හමුවේ රටේ ආර්ථික දිශානතිය සෘණ අගයක් ගැනීමත් සමග, සියලුම වාහන ආනයනය රජය මගින් නතර කරන ලදී. ඒ හේතුවෙන් අප ආයතනයට වාහනයක් මිලදී ගැනීමට අවශ්‍ය අනුමැතිය තාවකාලිකව අත්හිටවනු ලැබුණු අතර අධ්‍යාපන අමාත්‍යාංශය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් 2021.05.03 හා 2022.12.22 දිනැති ලිපි මගින් මෙම අරමුදල ආයතනයේ කළමණාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව ආයතනයට අත්‍යවශ්‍ය කරන ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකරනු ලෙස දැනුම් දෙනු ලැබිණි. තවද 2022 වසර සිට PGIIM ආයතනයට ප්‍රාග්ධන ප්‍රදාන වෙන් කිරීමක් සිදු නොවූ අතර 2023 දෙසැම්බර් සිට 2024 අනුමත ප්‍රසම්පාදන සැලැස්මට මෙම රු. මිලියන 07 වෙන් කර එම ප්‍රසම්පාදන කටයුතු සිදු කරගෙන යනු ලබයි.

පරිගනක මිලදී ගැනීමේ ක්‍රියාවලියෙන් 50% පමණ අවසන් වී ඇති අතර 2024 වර්ෂයේදී මෙම ක්‍රියාවලිය අවසන් කිරීමට කටයුතු කරන බව දන්වමි.

(ඈ) දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කරන්නේ 2019 පෙබරවාරි මාසයේ ප්‍රථම කළමණාකරණ රැස්වීම පැවැත්වීමත් සමග වේ. ඉන්පසු විෂය නිර්දේශ සකස් කර අනුමැතිය ගැනීම, පාඨමාලා ආරම්භ කිරීම සඳහා අවශ්‍යය භෞතික සම්පත් මිලදී ගැනීම පුහුණු කරුවන් හා පුහුණු මධ්‍යස්ථාන හඳුනාගැනීම වැනි ක්‍රියාකාරකම් වලින් පසු 2020 වසරේදී පළමු ශිෂ්‍ය කණ්ඩායම බඳවා ගන්නා ලදී. එම ශිෂ්‍ය කණ්ඩායම පෙර දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ලියාපදිංචිව සිට lateral entry යටතේ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට සම්බන්ධ වූ ශිෂ්‍ය කණ්ඩායමකි. 2021 වසරේදී සිසුන් බඳවා ගැනීමට නොහැකි වූයේ ඒ වන විට ආයුර්වේද අමාත්‍යාංශය හෝ ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් එක් එක් විශේෂඥතාවය යටතේ තනතුරු වෙන් වෙන් වශයෙන් දක්වා ආයතනය වෙත එවා නොමැති වීම, ඇතැම් පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය නවමත් ලැබී නොමැති වීම හේතුවෙන් කාලය, ශ්‍රමය සහ මුදල් ඉතිරිකර ගැනීම පිණිස එක් බඳවා ගැනීමේ පරීක්ෂණයක් පැවැත්වීමට සැලසුම් කිරීම, එවකට පැවැති කොවිඩ් උවදුර නිසා ආයතනය වසා තැබීම යනාදී හේතු නිසා වේ. 2022 වසරේදී එක් යූනානි පාඨමාලාවක් හා ආයුර්වේද පාඨමාලා 04ක් සඳහා සිසුන් බඳවාගෙන ඇත. මීට අමතරව Senior Registrar (Post MD) සිද්ධ පාඨමාලාව සඳහා 2023 වසරේදී සිසුන් තිදෙනෙකු බඳවාගෙන ඇත. වෛද්‍ය විශාරද ආයුර්වේද සහ අධ්‍යයන මණ්ඩල සහතිකය (MD and Board Certification) පාඨමාලා 04ක් සඳහා 2024 ඔක්තෝම්බර් 25 වැනි දින සිසුන් 12ක් බඳවා ගැනීමටත්, තවත් සිසුන් 04ක් ශාලාක්‍යතන්ත්‍ර හා භෛෂජ්‍ය කල්පනා රසශාස්ත්‍ර උපාධි පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලැබීමෙන් පසු බඳවා ගැනීමටත් කටයුතු සූදානම් කර ඇත.

අධ්‍යක්ෂ
දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

8. <u>තිරසර සංවර්ධනය සඳහා යෝජනාව</u>

<u>දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය</u>

1. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM) 2019 වසරේ දී පිහිටුවනු ලැබූ අතර සෞඛ්‍ය සේවා, විශ්වවිද්‍යාල සහ පෞද්ගලික අංශය සඳහා අවශ්‍ය කරන මානව සම්පත සම්පූර්ණ කිරීම පිණිස ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. සෞඛ්‍ය ව්‍යවස්ථා සංග්‍රහයට අනුව සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන ප්‍රධාන විශේෂඥ ක්ෂේත්‍රවල විශේෂඥ වෛද්‍යවරු සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයුර්වේද, යුනානි සහ සිද්ධ ආයතන සඳහා විශේෂඥයින් සැපයීම දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වගකීම වේ. ඒ අනුව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් දිවයිනේ මිනිස් බල අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම පිණිස සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම අරමුණ ඉටු කර ගැනීම පිණිස 2020 වසරේ දී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී. දේශීය වෛද්‍ය විද්‍යා විෂය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් පිරිනැමීම තුළින් දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය **සියලුම වයස් කාණ්ඩවල තැනැත්තන් සඳහා සෞඛ්‍ය සම්පන්න දිවිපැවැත්මක් සහතික කිරීමට සහ ඔවුන්ගේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමට** අනුබල දෙනු ලබයි.

2. ආයතනය ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය අංශය සඳහා සුදුසුකම්ලත් විශේෂඥ වෛද්‍ය සහ මණ්ඩල සහතික ලත් උපාධිධාරීන් බිහි කිරීම පිණිස අධ්‍යන කටයුතු පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව ආයතනය මඟින් තත්ත්ව සහතික වැඩසටහන් හරහා විශේෂඥ වෛද්‍ය උපාධි පුහුණුවන්නන්ගේ ඉහළම ගුණාත්මකභාවය පිණිස ශික්ෂණය පිරිනැමීමේ පරමාර්ථය ඇතිව දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා තත්ත්ව සහතික මධ්‍යස්ථානයක් පිහිටුවා ඇත. තවද ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමේදී අවශ්‍ය වන ඉගෙනුම් තොරතුරු මූලාශ්‍ර ශිෂ්‍යයන් වෙත ලබාදීම ඉතා වැදගත්ය. එසේම මෙම තොරතුරු සම්පත් විවිධ ව්‍යාප්ති සේවා හරහා ලබාදීම සිදුකර හැක. සියල්ලන්ට සමාන වූ තොරතුරු වෙත ප්‍රවේශවීමේ අවස්ථාව ලබාදීම, එසේම අධ්‍යාපනික අවස්ථා අවශ්‍යතා සඳහා කියවීමේ පහසුකම් සැපයීම මඟින් නිරන්තරව පර්යේෂණයන්හි හා අධ්‍යාපනික කටයුතු වල නිරතවීමට කාලය හා අවස්ථාව පර්යේෂකයන් සඳහා හිමිවනු ඇත. එබැවින් එය ගුණාත්මක අධ්‍යාපනයක් හා අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීමට උපකාරී වනු ඇත. පුස්තකාලය යනු අධ්‍යාපන ආයතනයක හදවත යනුවෙන් හැඳින්වේ. පශ්චාත් උපාධි ආයතනයක පුස්තකාලය යනු පර්යේෂණ වල නියැලෙන පර්යේශකයින් හට දැනුම් ලබාදෙන දැනුම් උල්පතයි. අධ්‍යන මණ්ඩල වල උපදෙස් පරිදි එකතු සංවර්ධනය සිදු කරගෙන යන අතර පුස්තකාලයේ අරමුණ වනුයේ මූලික වශයෙන් ඒ ඒ විෂයන්ට අදාළ මුද්‍රිත එකතුවක් ගොඩනැගීමෙන් අනතුරුව ඉලෙක්ට්‍රොනික් එකතුවක් ආරම්භ කිරීම හා සංවර්ධනය කරමින් ඊ පුස්තකාලයක් සංවර්ධනය කිරීමයි. ඒ අතරතුර විවිධ වශයෙන් පුස්තකාලය මඟින් විවිධ තොරතුරු වැඩමුළු සංවිධානය කිරීමට නියමිතයි. පුස්තකාල මූලාශ්‍ර භාවිතයට කියවීමේ අධ්‍යන කටයුතු වල නිරතවීමේ පහසුකම් ලබාදීම, අන්තර්ජාල පහසුකම් සැපයීම හා පරිගණක පහසුකම් සැපයීම යන ආකාරයට යටිතල පහසුකම් වර්ධනය කිරීමද ගුණාත්මක අධ්‍යාපනයට මගපාදයි **ශ්‍රී ලංකාව තුළ ගුණාත්මක අධ්‍යාපනය වැඩි දියුණු කිරීමට සහ ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීමට** අනුග්‍රහය දක්වනු ලැබේ.

3. ආයතනය **සෑමවිටම ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය සහ සමානාත්මතාව** පවත්වා ගැනීම පිණිස පියවර ගනු ලබයි. එහිදී පුස්තකාලය මඟින් වෛද්‍ය සිසුන්ගේ තොරතුරු අවශ්‍යතා සඳහා සහය වෙමින් තොරතුරු වෙත ප්‍රවේශවීමේ සිට එම තොරතුරු අත්පත් කර ගැනීම දක්වා වැඩ කටයුතු කරනු ලබයි. ඒ අනුව තොරතුරු සඳහා සාධාරණ ප්‍රවේශය, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, පුද්ගල නිදහස, සංස්කෘතික නිදහස හා **ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය** පුස්තකාලය තුළ ආරක්ෂා කෙරෙනු ඇත.
4. මෑතක දී පිහිටුවන ලද ආයතනයක් ලෙස දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය **සියලුම තැනැත්තන් සඳහා ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව සහ තිරසාර කළමනාකරණය තහවුරු කිරීම** පිළිබඳ ක්‍රියාවලිය දියත් කරමින් ඇත. මේ සඳහා මූලාරම්භයක් ලෙස, ආයතනය මඟින් කුණු කසළ දිරාපත් වන ද්‍රව්‍ය - වීදුරු, පොලිතීන්/ ප්ලාස්ටික් සහ කඩදාසි ආදී ලෙස වෙන් වෙන් වශයෙන් කාණ්ඩ කර, යෝග්‍ය පරිදි බැහැර කිරීම සඳහා පියවර ගෙන ඇත.
5. ආයතනය ශ්‍රී ලංකාව තුළ දේශීය වෛද්‍ය අංශය තුළ ආයුර්වේද, සිද්ධ සහ යුනානි යන ක්ෂේත්‍ර සඳහා විශේෂඥ වෛද්‍ය උපාධි පිරිනමනු ලබයි. මෙම විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් සඳහා විවිධ ජාතීන්ට අයත් පුහුණුවන්නන් සහභාගී වෙයි. මේ වන විට ආයුර්වේදය හා යුනානි පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් පමණක් ආරම්භ කර ඇති අතර සිද්ධ පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන් ද ඉතා ඉක්මනින් හඳුන්වාදීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ඉටු කරමින් තිබේ. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විවිධ ජාතීන් සහ ආගම්වලට අයත් පුහුණුවන්නන් අතර අන්‍යෝන්‍ය සුහදතාව ගොඩනැගීම පිණිස අවශ්‍ය සියලුම පියවර ගනු ලබයි.
6. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් පිරිනමනු ලබන සියලුම විශේෂඥ වෛද්‍ය උපාධිවල පශ්චාත්-විශේෂඥ උපාධි වැඩසටහනේ අවසන් වසර සඳහා එක් අවුරුදු විදේශීය පුහුණුවක් ඇතුළත් වේ. මේ සඳහා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් වෙනත් රටවල අධ්‍යාපන ආයතන සමඟ අවබෝධාත්මක ගිවිසුම්වලට එළැඹීමට සැලසුම් කරමින් ඇත. (විශේෂයෙන්ම විශේෂඥ වෛද්‍ය උපාධිධාරීන් සඳහා අවසන් වසර පුහුණුව ලබා ගැනීම පිණිස ඉන්දියාවේ උසස් අධ්‍යාපන ආයතන සමඟ ගිවිසුම්වලට එළැඹීමට අපේක්ෂා කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය හරහා දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් එහි ශිෂ්‍යයින්ට සහ කාර්ය මණ්ඩලයට ජාතික සහ අන්තර්ජාතික සබඳතා ගොඩනඟා ගැනීම සඳහා අවකාශය සලසා දෙනු ලැබේ.)
7. තවද අන්තර්ජාතික වශයෙන් වැදගත් තොරතුරු මූලාශ්‍ර සඳහා ප්‍රවේශය ලබාගැනීම් මඟින් දැනුම් සම්භාරයක් සිසුන්ට ලබාගත හැකි වේ. පුස්තකාල ජාල සමඟ සම්බන්ධ වෙමින් නව දැනුම් උත්පාදනයන් සඳහා ප්‍රවේශ වීමට කටයුතු යොදා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ තොරතුරු ජාලය, සෞඛ්‍ය සඳහා ප්‍රවේශ වීමට කටයුතු යොදා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ තොරතුරු ජාලය, සෞඛ්‍ය සාහිත්‍ය, පුස්තකාල හා තොරතුරු විද්‍යාව යන ජාල සඳහා, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, ශ්‍රී ලංකා ජාතික ස්තකාලය යන ආයතන හා පුස්තකාල තොරතුරු ජාල සමඟ සම්බන්ධ වෙමින් අන්තර් සහයෝගීතාවය ඇති කර ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව නව දැනුම් උප්පාදනයන්ට, පර්යේෂනයන් සඳහා අවශ්‍ය වන දැනුමින් සන්නද්ධ කිරීම සඳහා වන පුස්තකාල හා තොරතුරු සේවාවන් පුස්තකාලය විසින් පවත්වාගෙන යනු ලබයි.

9. භෞතික සහ මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය

භෞතික කාර්ය සාධන විශ්ලේෂණය

ආයුර්වේද වෛද්‍ය විශාරද සහ අධ්‍යයන මණ්ඩල සහතික විභාගය සහ උපාධි ප්‍රදානෝත්සවය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි ප්‍රථම වෛද්‍ය විශාරද අවසාන විභාගය ආයුර්වේද විශේෂතා පහක් යටතේ 2023 අගෝස්තු/සැප්තැම්බර් මාසවලදී සාර්ථකව පවත්වන ලද අතර එයින් සමත්වූවන් 2024 ජනවාරි මාසයේදී කොළඹ විශ්වවිද්‍යාලයේ පැවති පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවයේදී වෛද්‍ය විශාරද උපාධිය ලබාගන්නා ලදි. තවද, එකී සිසුන් වෙනුවෙන් පළමු ආයුර්වේද Senior Registrar වැඩසටහන 2023 සැප්තැම්බර් මාසයේදී ආරම්භ විය.

ආයතනික සමාලෝචන දායකත්වය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ආයතනයේ ස්වයං ඇගයීම් වාර්තාව (self-evaluation report) සැකසීමෙන් සහ කාර්ය මණ්ඩලය සමඟ පැවති සාකච්ඡාවටහොඳින් සහභාගී වීමෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ ආයතනික සමාලෝචනයට (Institutional review) දායකත්වයක් ලබා දෙන ලදි. 2023 ජූලි මාසයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික මධ්‍යස්ථානය(Quality Assurance Council) විසින් පවත්වන ලද ආයතනික සමාලෝචනයේදී කොළඹ විශ්වවිද්‍යාලයට ලකුණු 84ක් සමඟින් “A” ශ්‍රේණියක් හිමි විය. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මෙම ඇගයීමට දක්වන ලද දායකත්වය ගැන ආඩම්බර වේ.

ආයුර්වේද වෛද්‍ය විශාරද සහ අධ්‍යයන මණ්ඩල සහතික කිරීමේ වැඩසටහන

ආයුර්වේද වෛද්‍ය විශාරද සහ අධ්‍යයන මණ්ඩල සහතික සහ මණ්ඩල සහතික කිරීමේ වැඩසටහනේ අවසන් වසරට වසරක විදේශීය පුහුණුවක් ඇතුළත් වේ. අභ්‍යාසලාභීන් සඳහා වඩා හොඳ පුහුණුවක් සහ පර්යේෂණ අත්දැකීම් ලබා දීම සඳහා, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ඉන්දියානු පර්යේෂණ ආයතනයක් සහ ඉන්දියාවේ ආයුෂ් අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට පියවර ගෙන ඇත.

මානව සම්පත් සංවර්ධනය

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් එහි කාර්ය මණ්ඩලය සඳහා ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ ප්‍රේරක පුහුණුව සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී. ස්ථිර ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරයෙකු නොමැති වීම 2023 වර්ෂයේදී දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි මූල්‍ය මෙහෙයුම් කාර්යක්ෂමව පවත්වා ගැනීමට බාධා ඇතිකරන ලදි. තවද, වැඩ සහයකවරු නොමැතිකමද පරිපාලන හා මූල්‍ය ක්‍රියාකාරකම්වල කාර්යක්ෂමතාවයට බලපෑම් ඇති කරන ලදි. කෙසේ වෙතත්, සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කැපවීම මෙම අභියෝග ජය ගැනීමට උපකාරී විය.

මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය

2023 සඳහා මුළු වියදම රු. 30,625,701 දිගුකාලීන ආයෝජන සමඟ මෙහෙයුම් කාර්යක්ෂමතාව සමතුලිත කිරීමට ආයතනයේ කැපවීම පිළිබිඹු කරයි. විශාලතම වියදම් කාණ්ඩය වන පුද්ගල වැටුප් රු. 19,726,671කි. මෙම වියදම මගින් වැටුප්, දීමනා සහ අනෙකුත් සේවක සම්බන්ධ වියදම් ආවරණය වන අතර, දක්ෂ ශ්‍රම බලකායක් පවත්වාගෙන යාම සඳහා ආයතනයේ කැපවීම ඉස්මතු කරයි. ඒ හා සමානව, කොන්ත්‍රාත් සේවා, රු. 6,355,405 ආයතනයේ මෙහෙයුම් සහ නඩත්තු අවශ්‍යතා සඳහා ඵලදායී ලෙස සහාය විය.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබාදෙන ලද ප්‍රාග්ධන ප්‍රදානය රු. 6,105,000 යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් සහ ප්‍රාග්ධන උපකරණ අත්පත් කර ගැනීම සඳහා උපායමාර්ගිකව භාවිතා කරන ලද අතර, ආයතනය එහි වර්ධන අරමුණු සමඟ සමපාතව පවතින බව සහතික කරයි. සාම්ප්‍රදායික අරමුදල් ප්‍රභවයන්ගෙන් ඔබ්බට ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීම සඳහා ආයතනයේ ක්‍රියාකාරී ප්‍රවේශය ජනනය කරන ලද ආදායම සමඟින් ආදායම් උත්පාදන මුලපිරීම් තවත් කැපී පෙනෙන අංගයක් විය. මීට අමතරව, රු.711,006ක් පුස්තකාල පොත් මිලදී ගැනීම සඳහා ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල සංවර්ධනය යන දෙඅංශයෙන්ම ප්‍රවර්ධනය කරන අධ්‍යයන සම්පත් සඳහා ආයෝජනයක් සනිටුහන් කරයි.

ප්‍රාග්ධන වියදම් ලෙස රු.මි. 22,425 ඉගැන්වීම් සහ කාර්යාල උපකරණද රු. 41,500ක පරිගණක සහ උපාංගද රු. 192,232 ගොඩනැගිලි සහ ව්‍යුහයන්ට අදාල වියදම්ද ඇතුලත් විය. මෙම වියදම් පුනරාවර්තන වියදම් හා සසඳන විට මධ්‍යයස්ථ වූවත්, ආයතනික ධාරිතාව ගොඩනැගීම සඳහා ඉදිරි දැක්මක් සහිත ප්‍රවේශයක් අවධාරනය කරයි. මේ අතර, ආයතනයේ එදිනෙදා කටයුතු සඳහා සහාය වීම සඳහා සැපයුම් (රු. 643,482) සහ ප්‍රවාහන (රු. 28,158) වැනි මෙහෙයුම් වියදම් දූරදර්ශී ලෙස කළමනාකරණය කරන ලදී.

මූල්‍ය වගකීම් සහතික කිරීමේ උත්සාහයන් පිරිවැය කළමනාකරණය සහ අනුකූලතාව පිළිබඳ අවධාරණයෙන් පැහැදිලි වේ. විවල්‍යතා විශ්ලේෂණ මගින් අයවැය ප්‍රමාණයන්ගෙන් අපගමනය හඳුනා ගැනීමට උපකාරී වන අතර, සියලු වියදම් උපායමාර්ගික ප්‍රමුඛතා සමඟ සමපාත වන බව සහතික කරයි. තවද, උපාංග හා සවි කිරීම් වැනි වියදම් නොකළ ප්‍රතිපාදන, අනාගතයේ දී වැඩිදියුණු කළ සැලසුම් කිරීම හෝ සම්පත් නැවත වෙන් කිරීම සඳහා අවස්ථා යෝජනා කරයි.

අවසාන වශයෙන්, 2023 සඳහා වන මූල්‍ය කාර්ය සාධනය විනිවිද පෙනෙන ලියකියවිලි සහ ඵලදායී පිරිවැය කළමනාකරණය මගින් සහාය දක්වන මෙහෙයුම් අවශ්‍යතා සහ දිගු කාලීන ආයෝජන සඳහා සමබර ප්‍රවේශයක් පිළිබිඹු කරයි. කාර්යක්ෂමතාව, අනුකූලතාව සහ උපාය මාර්ගික සැලසුම්කරණය කෙරෙහි අඛණ්ඩ අවධානය යොමු කිරීම ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වය සහ එහි අරමුණු සපුරාලීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් කරනු ඇත.
තවදුරටත් මෙම වර්ෂයේ අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව කළමණාකරණය කිරීමට ආයතනයට හැකියාව ලැබී ඇති බව පැහැදිලි වන අතර 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව විගණකාධිපති විසින් අවසන් විගණන වාර්තාවෙන් දැනුම් දී ඇත

මූල්‍ය ප්‍රගතිය විශ්ලේෂණය 2023

දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

පුනරාවර්තන වියදම්

මාතෘකාව	2023 (රු.)
අ. වැටුප් හා වේතන	19,726,671
ආ. ගමන් ගාස්තු	28,158
ඇ. සැපයුම්	643,482
ඈ. නඩත්තු වියදම්	182,511
ඉ. කොන්ත්‍රාත් සේවා	6,355,405
ඊ. අනෙකුත්	2,722,311
එකතුව	**29,658,538**

ප්‍රාග්ධන වියදම්

මාතෘකාව	2023 (රු.)
අ. කාර්යාල හා ඉංජිනීම් උපකරණ	22,425
ආ. පරිගනක සහ පරිගනක උපාංග	41,500
ඇ. ගොඩනැගිලි සහ ව්‍යුහයන්	192,232
ඉ. පුස්තකාල පොත්	711,006
ඊ. උපාංග හා සවිකිරීම්	-
එකතුව	**967,163**

මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) - වැටුප් හා වේතන

මාතෘකාව	අරමුදල් ලැබීම් (රු.)	වියදම (රු.)	ඉතුරුම්/අතිරික්තය (රු.)
	2023	2023	2023
අ. වැටුප් හා වේතන	15,000,000	19,726,671	(4,726,671)
එකතුව	**15,000,000**	**19,726,671**	**(4,726,671)**

මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) - උත්පාදිත ආදායම

මාතෘකාව	ප්‍රතිපාදන (රු.)	වියදම (රු.)	ඉතුරුම්/අතිරික්තය (රු.)
	2023	2023	2023
අ. උත්පාදිත ආදායම	10,257,000	9,931,867	325,133
එකතුව	**10,257,000**	**9,931,867**	**325,133**

මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (MOHE ප්‍රදානය)

ආදායම් මූලාශ්‍රය	ප්‍රතිපාදන (රු.)	වියදම (රු.)	ඉතුරුම්/අතිරික්තය (රු.)
	2023	2023	2023
අ. MOHE ප්‍රදාන (ප්‍රාග්ධන)	6,105,000	967,163	5,137,837
එකතුව	**6,105,000**	**967,163**	**5,137,837**